# Path to Success – Study Pack

## තෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## ඉතිහාසය - 10 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාල - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී.ඉරෝෂිනී කේ. පරණගම මිය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

එෆ්.එච්.ජේ. පී. සිල්වා මයා

නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( අධ්‍යාපන සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**

කේ.එල් නිල්මිණි පෙරේරා මෙය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යා )

**සම්පත් දායකත්වය**

- සෝමා දීගල්ල මිය - ගුරු උපදේශක (සමාජ විද්‍යා - කැලණිය කොට්ඨාසය)
- අසංකා උපුලි ජයසුන්දර මිය - විහාරමහාදේවි බා.ම.වි.
- ආර්.ඒ. අයේෂා ලක්මාලි මිය - විහාරමහාදේවි බා.ම.වි
- සජිත් කරුණාරත්න මයා - විහාරමහාදේවි බා.ම.වි

සියලු හිමිකම් ඇවිරිණි

# 10 ශ්‍රේණිය - ඉතිහාසය

# <u>මහනුවර රාජධානිය</u>



## <u>*මහනුවර රාජධානිය හැදින්වීම හා ආරම්භය*</u>

## <u>*මහනුවර රාජධානිය හැදින්වීම*</u>

මෙය ශ්‍රී ලංකාවේ අවසාන රාජධානියයි

- මහනුවර රාජධානිය 15 සියවස අග භාගයේදී සෙන්කඩගල නගරය කේන්ද්‍ර කොටගෙන ආරම්භ විය
- මහනුවර රාජධානිය ස්භාවික රැකවරණය සහිත භූමියක පිහිටි පාලන මධ්‍යස්ථානයකි
- මෙහි ස්භාවික රැකවරණය නිසා ක්‍රිෘව 1815 වන තෙක් විවිධ සතුරු බලවේග හමුවේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට සමත් විය
- අනුරාධපුරය හැරුණු විට දීර්ඝතම කාලයක් පැවති රාජධානියද මෙයයි

## <u>මහනුවර රාජධානිය භෞතික ලක්ෂණ</u>

- ***කදුවැටි*** - උඩවත්ත කදුවැටිය , හන්තාන කදුවැටිය
- ***ගංගා*** - මහවැලි ගංගාව
- ***දුර්ග මාර්ග*** - බලන , හුන්නස්ගිරිය

 මීට අමතරව සානු, නිම්න, දිය ඇලි ආදි ලක්ෂණවලින්ද සමන්විතය

## <u>*මහනුවර රාජධානිය හැදින්වූ වෙනත් නම්*</u>

සෙන්කඩගලපුර

කන්ද උඩරට

උඩරට රාජධානිය

කන්දෙ නුවර

කන්ද උඩ පස්රට

ශ්‍රී වර්ධනපුරය

# මහනුවර රාජධානියේ ආරම්භය

- හයවන පරාක්‍රමබාහු රජ සමයේ මහනුවර රාජධානිය

  කෝට්ටේ රාජධානියට යටත් රාජධානියක් ලෙස පැවතුණි
- මහනුවර රාජධානියේ ප්‍රාදේශීය පාලකයා වූ ජෝතිය සිටුවරයා එය කෝට්ටේ රාජධානියෙන් නිදහස් කර ගැනීමට කැරැල්ලක් ඇති කළේය
- කෝට්ටේ රාජධානියේ හයවන පරාක්‍රමබාහු රජුගේ මරණින් පසු මහනුවර රාජධානිය ක්‍රමයෙන් බලවත් වන්නට විය




# *මහනුවර රාජධානිය ආරම්භක පාලකයින්*

- සේනා සම්මත වික්‍රමබාහු
- ජයවීර බණ්ඩාර
- කරලියැද්දේ බණ්ඩාර
- වීරසුන්දර බණ්ඩාර
- නිකපිටියේ බණ්ඩාර
- යමසිංහ බණ්ඩාර
- විමලධර්මසූරිය රජතුමා

## පළවන විමලධර්මසූරිය රජතුමා (ක්‍රි:ව 1592-1604)

වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර පළවන විමලධර්මසූරිය නමින් උඩරට රජ විය

| **පළවන විමලධර්මසූරිය රජු මුහුණ දුන් අභියෝග** | **පළවන විමලධර්මසූරිය රජු එම අභියෝග ජයගත් ආකාරය** |
|---|---|
| නිත්‍යානුකූල රාජ්‍ය උරුමයක් නොවීම | ❑ කුසුමාසන දේවිය විවාහ කර ගැනීම<br>❑ කතෝලික ආගම අතහැර බුදුදහම වැළඳ ගැනීම<br>❑ විමලධර්මසූරිය නමින් බෞද්ධ නමක් ලබා ගැනීම<br>❑ දෙල්ගමුවේ සඟවා තිබූ දන්න ධාතුව මහනුවරට වැඩම කරවීම |
| උඩරට රාජධානිය පෘතුගීසි ග්‍රහණයෙන් මුදවා ගැනීම | ❑ ක්‍රි:ව 1594 දන්තුරේ සටනින් සහ ක්‍රි:ව 1602 බලන සටනින් පෘතුගීසින් පරාජය කිරීම<br>❑ පෘතුගීසින් පලවා හැරීමට ලන්දේසි සහය ලබාගැනීමට උත්සහ කිරීම |
| උඩරට රාජධානිය සීතාවක බලපෑමෙන් මුදවා ගැනීම | ❑ උඩරැටියන්ගේ සහයෝගයෙන් පළවන රාජසිංහ රජු පරාජය කිරීම |
| පරිහානියට පත් බුදුසසුන නගා සිටුවීම | ❑ බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම<br>❑ලංකාතිලකය ගඩලාදෙණිය සහ රිදිවිහාරය වැනි වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම |
| මහනුවර රාජධානියේ ආර්ථික කටයුතු දියුණු කිරීම | ❑ ගොවිතැන දියුණු කිරීම<br>❑ කපු වගාව දියුණු කිරීමට අනුබල දීම<br>❑ කොත්මලේ සහ වලපනේ ප්‍රදේශ වල යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම<br>❑ වෙඩි ලුණු කර්මාන්තය දියුණු කිරීම |

## සෙනරත් රජතුමා (ක්‍රි:ව 1604-1635)

පළවන විමලධර්මසූරිය රජුගේ ඥාති සහෝදරයෙකි

මෙතුමා රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීමට කුසුමාසන දේවිය විවාහ කර ගත්තේය

මෙතුමාගෙන් පසු රාජධානිය පුතුන් තිදෙනාට පවරන ලදී

ඌව - කුමාරසිංහ කුමරු

මාතලේ - විජේපාල කුමරු

මහනුවර - මහා අස්ථාන කුමරු

## දෙවන රාජසිංහ රජතුමා (ක්‍රි:ව 1635-1687)

පියාගෙන් පසු මහා අස්ථාන කුමරු දෙවන රාජසිංහ නමින් උඩරට රජ විය

| දෙවන රාජසිංහ රජු මුහුණ දුන් අභියෝග | අභියෝග ජයගත් ආකාරය |
|---|---|
| පෘතුගීසින්ගෙන් උඩරටට එල්ල වන ප්‍රහාර මැඩපැවැත්වීම | ක්‍රි:ව 1630 රන්දෙණිවෙල සටනින් සහ ක්‍රි:ව 1638 ගන්නොරුව සටනින් පෘතුගීසින් පරාජය කිරීම |
| පෘතුගීසින් මෙරටින් පලවා හැරීම | ක්‍රි:ව 1638 දි ලන්දේසි සහය ලබාගෙන 1658 වන විට පෘතුගීසින් මෙරටින් පලවා හැරීම |
| ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම | ක්‍රි:ව 1670 - 1675 කාලයේදි ලන්දේසින්ට ප්‍රහාර එල්ල කොට ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම |
| උඩරට රදළ ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජන අවම කර ගැනීම | |

## දෙවන විමලධර්මසූරිය රජතුමා (ක්‍රි:ව 1687-1707)

දෙවන රාජසිංහ රජුගේ පුත් දෙවන විමලධර්මසූරිය නමින් උඩරට රජ විය

මෙතුමා දක්ෂ පාලකයෙකු නොවිය

ලන්දේසින් සමඟ සාමකාමීව කටයුතු කළේය

ලන්දේසින්ගේ උපකාර ලබාගෙන බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒමට කටයුතු කළේය

## ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා (ක්‍රි:ව 1707-1739)

දෙවන විමලධර්මසූරිය රජුගේ පුත් ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු උඩරට රජ විය

මෙතුමා සිංහල රාජ වංශයේ අවසාන රජතුමාය

## නායක්කර් වංශික රජවරු

1 ශ්‍රී විජය රාජසිංහ රජතුමා (ක්‍රි:ව 1739-1747)

2 කිර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ක්‍රි:ව 1747-1781)

3 රාජාධිරාජසිංහ රජතුමා ((ක්‍රි:ව 1781-1798)

4 ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (ක්‍රි:ව 1798-1815)

## ශ්‍රී විජය රාජසිංහ රජතුමා (ක්‍රි:ව 1739-1747)

මෙතුමාගෙන් ඇරඹි නව රාජ වංශය නායක්කර් වංශය ලෙස හැඳින්වේ

ශ්‍රී විජය රාජසිංහ රජු මුහුණ දුන් ප්‍රධාන අභියෝගය වූයේ උඩරට රාජ සභාවේ රදල ප්‍රධානීන්ගේ බලය වර්ධනය වී තිබීම ය.

ඔහු නායක්කර් පරම්පරාවේ ඥාතීන්ට උඩරට රාජ සභාවේ තනතුරු ලබා දුන්නේය

දරුවන් නොසිටි බැවින් රාජ්‍ය උරුමකරුවකු නොතබා ම වර්ෂ 1747 දි මිය ගියේය

## කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ක්‍රිව 1747-1781)

ශ්‍රී විජය රාජසිංහ රජුගේ මරණයෙන් පසුව එතුමාගේ බිසවගේ සොහොයුරු වූ කීර්ති ශ්‍රී රාජසිංහ වර්ෂ 1747 දී උඩරට රාජධානියේ රජු බවට පත් විය

වැලිවිට සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි රට පුරා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීමට මේ රජු ක්‍රියා කළේය

| |
|---|
| **මෙතුමාගේ සේවාවන්**<br><br>සියම් දේශයට දූතයන් යවා උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් මෙරටට වැඩමවා වර්ෂ 1753 දී ය. එමගින් වර්තමාන සියම් නිකායේ ආරම්භය සිදු විය.<br><br>උඩරට හා පහත රට ප්‍රදේශවල පැවැති විහාරාරාම ප්‍රතිසංස්කරණය කරවීම<br><br>වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුර ප්‍රදානය කිරීම |

ක්‍රි:ව 1766 දී රජතුමා හා ලන්දේසීන් අතර සාම ගිවිසුමක් අත්සන් කරන ලදි

උඩරට සිංහාසනයට උරුමකරුවෙකු නොතබා වර්ෂ 1781 දී මිය ගියේ ය.

## රාජාධි රාජසිංහ රජතුමා (ක්‍රිව 1781-1798)

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසු ඔහුගේ සහෝදරයා රාජාධිරාජසිංහ නමින් උඩරට රජ බවට පත්විය.

මෙම රාජ්‍ය සමයේ දී සිදු වූ වැදගත් සිදු වීමක් වූයේ ක්‍රිස්තු වර්ෂ 1796 දී ඉංග්‍රීසීන් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ අල්ලා ගැනීමයි

මෙතුමාද අනුප්‍රාප්තිකයෙකු නොතබා ම වර්ෂ 1798 දී මිය ගියේය

## ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (ක්‍රිව 1798-1815)

පිළිමතලව්වේගේ උපකාරයෙන් කන්නසාමි කුමරා ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් උඩරට රජ විය

රජුගේ ක්‍රියා කලාපය හේතුවෙන් උඩරට භික්ෂූන්වහන්සේලගේත්, රදළ ප්‍රධානීන්ගේත් සාමාන්‍ය මහජනතාවගේත් පක්ෂපාතීත්වය රජුට අහිමි විය

උපායශීලි ව කටයුතු කළ ඉංග්‍රීසිහු 1815 පෙබරවාරි මාසයේ දී උඩරට රාජධානියට හමුවට යවා රජු අත්අඩංගුවට ගත්හ

ඉංග්‍රීසි අත්අඩංගුවේ සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඔවුන් විසින් වෙල්ලෝරයට පිටුවහල් කරන ලදි

ඒ අනුව ක්‍රි:ව 1815 දී උඩරට ඇතුළු සමස්ත දිවයිනම ඉංග්‍රීසීන් යටතට පත්විය

# මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය

## රජු

රටේ ඉහළ ම බලය හිමි තැනැත්තාය

රටේ සාමය පවත්වාගෙන යෑම හා ආරක්ෂාව සැලසීම රජුගේ ප්‍රධාන කාර්යයන් වේ.

රටේ ඉහළ ම අධිකරණය රජු වූ අතර වැරදිකරුවෙකුට මරණ දණ්ඩනය පැනවීමේ හිමි විය

## මහ අධිකාරම්වරු

මහ අදිකාරම් හා දෙවන අධිකාරම් ලෙස හැඳින් වූ අදිකාරම් තනතුරු දෙකක් පැවතුණි.

මහ අදිකාරම් පල්ලෙගම්පහ අදිකාරම් ලෙසත්, දෙවන අදිකාරම් උඩගම්පහ අදිකාරම් ලෙසත් හැඳින්විණ.

අදිකාරම්වරුන්ගේ අත හෝ පණිවිඩ ප්‍රදේශිය නිලධාරීන් කරා ගෙන ගිය පිරිස කටුපුල්ලේ පණිවිඩකරුවන් ලෙස හැඳින්විණ

### මහවාසල

**රජු හා රජවාසල පිරිසට සේවා සැපයීම සිදු කළ නිලධාරින්**

ගජනායක නිලමේ

මහලේකම්

මහ ගබඩා නිලමෙ

දියවඩන නිලමෙ

හළු වඩන නිලමෙ

බත් වඩන නිලමෙ

අස් පන්තියෙ මුහන්දිරම්

කවිකාර මඩුවෙ මුහන්දිරම්

### රට වසම හෙවත් ප්‍රාදේශිය පාලනය

| | |
|---|---|
| රට 09 | දිසාවනි 12 |
| (රටේ මහත්වරු) | (දිසාවේ) |
| ↓ | ↓ |
| කෝරළ | කෝරළ |
| (කෝරළේ) | (කෝරළේ) |
| ↓ | ↓ |
| පත්තු | පත්තු |
| (අතු කෝරාළ) | (අතු කෝරාළ) |
| ↓ | ↓ |
| ගම් | ගම් |
| ( විදානේ) | (විදානේ) |

### බද්දේ

මඩිගෙ බද්ද

(ප්‍රවාහන කටයුතු)

කුරුවෙ බද්ද

(ඇතුන් ඇල්ලීම)

බඩහැල බද්ද

(වළං තැනීම)

රදා බද්ද

(රෙදි සේදීම)

හැඳ බද්ද

(රෙදි විවීම)

### විහාර දේවාල පාලනය

මහනායක හා අනුනායක හිමිවරුන්ගේ මූලිකත්වයෙන් සිදු විය

දළදා මාළිගාවේ කටයුතු - දියවඩන නිලමෙතුමා

විහාර හා දේවාල නඩත්තුව පුද පූජා සංවිධානයට හා පෙරහැර කටයුතුවලට ගම්වර ලැබූ රාජකාරි ශ්‍රමය සැපයූ පිරිස් සිටියහ

## අධිකරණ කටයුතු

ඉහළ ම අධිකරණ බලතල රජු සතු විය

**රජතුමා විසින්ම විසඳන ලද නඩු වර්ග**

වැදගත් නායකයන් සම්බන්ධ නඩු

රාජද්‍රෝහීත්වය පිළිබඳ නඩු

කැරලි කෝලාහල පිළිබඳ නඩු

විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු

කුමන්ත්‍රණ පිළබඳ නඩු

## වැරදිකරුවන්ට ලබා දුන් දඬුවම්

අතුල් පහර දීම

කස පහර දීම

රොඩී රැහැට දැමීම

දඩ ගැසීම

ඉපලෙන් තැලීම

හිසකෙස් කැපීම

දඬු කඳේ ගැසීම

දඟ ගෙයි ලෑම

දියේ ගිල්වා මැරීම

ඇතුන් ලවා පාගා

පිටුවහල් කිරීම

### මහනුවර රාජධානියේ ආර්ථිකය

- කෘෂි කර්මාන්තය
  - **වී වගාව**
    - හෙල්ම ළු ක්‍රමයට
  - **හේන් වගාව**
    - කුරක්කන්
    - අමු
    - මෙනේරි
    - ඉරිඟු
    - මුං
    - තල
    - අල
    - බතල
  - **ගෙවතු වගාව**
    - කොස්
    - දෙල්
    - ගම්මිරිස්
    - සාදික්කා
    - කරදමුංගු
    - පුවක්
    - බුලත්
    - එළවළු
    - පළතුරු
  - **සත්ත්ව පාලනය**
    - ගවයන්
    - එළුවන්
    - කුකුළන්
- කර්මාන්ත
  - යකඩ කර්මාන්තය
  - දැව කර්මාන්තය
  - ලාක්ෂා කර්මාන්තය
  - ලෝහ කර්මාන්තය
  - පන් කර්මාන්තය
  - පේෂ කර්මාන්තය
  - මැටි කර්මාන්තය
- වෙළඳාම
  - දේශීය
  - විදේශීය
    - **අපනයන**
      - කුරුඳු
      - ගම්මිරිස්
      - පුවක්
      - ඇත් දත්, ඇතුන්
      - මුතු
      - මැණික්
      - බුලත්,
      - පුවක්
      - කරදමුංගු,
      - කරාබු නැටි
      - සාදික්කා
      - මී ඉටි
    - **ආනයන**
      - අශ්වයන්
      - පිඟන් භාණ්ඩ
      - රෙදි පිළි
      - කරවල
      - මැටි බඳුන්
      - සුවඳ වර්ග

# සමාජ සංවිධානය

1 ඉඩම්, අයිතිය හා බුක්තිය

ගබඩාගම- රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම්

නින්දගම්- රදල ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම්

විහාරගම්- විහාරාරාම සාදා පූජා කළ ඉඩම්

දේවාලගම - දේවාල සඳහා පූජා කළ ඉඩම්

පරවේණිගම (නින්දගම) - ගම් වැසියන් පරම්පරාගත ව බුක්ති විඳි ඉඩම්

2 ස්වයංපෝෂිත ග්‍රාමීය ආර්ථිකයක් පැවතීම

3 රාජකාරි සේවා ක්‍රමය ක්‍රියාත්මක වීම

4 සමාජ සම්බන්ධතා කුල ක්‍රමය මත පදනම් වීම

5 කුලයට වෙන් වූ ආර්ථික කටයුතු දක්නට ලැබීම

6 පවුල ප්‍රධාන සමාජ ඒකකය විය.

7 ගුණගරුක බව සමාජයේ ප්‍රකට ලක්ෂණය විය

8 පන්සල ගැමි දිවිය හා බැඳුණු මධ්‍යස්ථානය විය

9 ආවාහ විවාහ කටයුතු කුලය පදනම් කරගෙන සිදු වීම

10 විවාහ ක්‍රම 3 ක් දක්නට ලැබීම

දීග විවාහය

බින්න විවාහය

එක ගෙයි කෑම

## අභ්‍යාස

1 මහනුවර රාජධානිය හඳුන්වන වෙනත් නම් මොනවාද?

2 මහනුවර රාජධානියට ස්වභාවික ආරක්ෂාව ලැබුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න

3 කරලියැද්දේ බණ්ඩාර රජුගේ දියණිය හා බෑනා නම් කරන්න

4 බෞතීස්ම ලැබීමෙන් පසු ඔවුන්ගේ නම් මොනවාද?

5 පළවන විමලධර්මසූරිය සිය අභියෝග ජය ගත් ආකාරය  කරුණු 3ක් ඇසුරින් විස්තර කරන්න

6 සෙනරත් රජුගෙන් පසු මහනුවර රාජධානිය බෙදිගිය ආකාරය ලියන්න

7 දෙවන රාජසිංහ රජතුමාගේ සේවාවන් කෙටියෙන් විස්තර කරන්න

8 නායක්කාර් වංශික රජවරු 4 දෙනා නම් කරන්න

9 කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සේවාවන් ලියා දක්වන්න

10 ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා පිටුවහල් කරන ලද්දේ කුමන ප්‍රදේශයකටද?

11 මහනුවර රාජධානියේ රජතුමා සතු වූ බලතල මොනවාද?

12 අදිකාරම්වරු යටතේ පාලනය වූ ප්‍රදේශ මොනවාද?

13 මහවාසල නිලධාරීන් නම් කර ඔවුන්ට පැවරුණු කාර්යයන් ලියන්න

14 රට 9 සහ දිසාවනි 12  නම් කරන්න

15 මෙම යුගයේ අය කරන ලද බදු වර්ග මොනවාද?

16 රජතුමා විසින් විසඳන ලද නඩු වර්ග මොනවාද?

17 මහනුවර යුගයේදී වැරදි කරුවන්ට ලබා දුන් දඬුවම් මොනවාද?

18 මහනුවර යුගයේ ආර්ථික කටයුතු සංවිධානය වී පැවති ආකාරය කරුණු 3ක් ඇසුරින් විස්තර කරන්න

19 මහනුවර යුගයේ ඉඩම් අයිතිය හා භුක්තිය පැවති ආකාරය ලියන්න

20 මහනුවර යුගයේ සමාජය සංවිධානය වී පැවති ආකාරය කරුණු 3ක් ඇසුරින් විස්තර කරන්න

සැකසුම :- ආර්.ඒ.අයේෂා ලක්මාලි    - විහාරමහාදේවි බාලිකා විද්‍යාලය, කිරිබත්ගොඩ

# 09 වන පාඩම

## පුනරුදය

❖ යුරෝපා ඉතිහාසය අධ්‍යයනයේ පහසුව සඳහා යුග තුනකට බෙදා දැක්විය හැකිය.

| යුගය | කාල පරාසය | ප්‍රධාන ශිෂ්ටාචාරය | සමාජ ක්‍රමය | දේපල |
|---|---|---|---|---|
| පුරාතන යුගය | ක්‍රි. පූ 5 - ක්‍රි. ව 5 සියවස දක්වා | ග්‍රීක රෝම ශිෂ්ටාචාර | වහල් සමාජ ක්‍රමය | වහලුන් |
| මධ්‍යතන යුගය | ක්‍රි.ව 5 - ක්‍රි. ව 15 සියවස දක්වා | ශුද්ධ රෝම අධිරාජ්‍ය | වැඩවසම් සමාජ ක්‍රමය | ඉඩම් |
| නූතන යුගය | ක්‍රි.ව 15 සියවස සිට මේ දක්වා | ජාතික රාජ්‍ය | ධනවාදි සමාජ ක්‍රමය | මුදල් |

❖ වැඩවසම් සමාජ ක්‍රමය යනු,

ක්‍රි. ව 5 - ක්‍රි. ව 15 සියවස දක්වා යුරෝපයේ සියළුම රටවල පැවති දේශපාලන, ආර්ථික හා සමාජ ක්‍රමය වැඩවසම් සමාජ ක්‍රමය යනුවෙන් හදුන්වයි. මෙහිදි රජුගේ සිට පහලම මට්ටමේ ඉඩම් හිමියා දක්වා ඉඩම් භුක්ති විදිමින් සේවා සැපයීමේ ක්‍රමයක් ක්‍රියාත්මක විය.

❖ වැඩවසම් සමාජ ක්‍රමයේ ආරම්භය සිදු වු අයුරු

- ක්‍රිස්තු වර්ෂ පළවෙනි සියවසේ රෝම අධිරාජ්‍යයේ පාලනයේ පහසුව සඳහා බටහිර නැගෙනහිර ලෙස කොටස් දෙකකට බෙදුණි.
- ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ බටහිර රෝම අධිරාජ්‍යයට ජර්මන් ප්‍රදේශවලින් ම්ලේච්ඡ ආක්‍රමණ එල්ල විය.
- මෙම ආක්‍රමණ මඟින් බිඳවැටුණු බටහිර රෝම අධිරාජ්‍යය මත කැරොලින්ජියානු අධිරාජ්‍යය බිහිවිය.
- ක්‍රිස්තු වර්ෂ නවවන සියවස පමණ වන විට කැරොලින්ජියානු අධිරාජ්‍යය පරිහානියට පත් වෙද්දී දකුණින් මුස්ලිම්වරු, නැගෙනහිරින් හන්වරු, උතුරෙන් වෛකින්වරුන්ගේ ආක්‍රමණ එල්ල විය.
- මෙම ආක්‍රමණවලට මුහුණ දීමට තරම් රජු ශක්තිමත් නොවීය. එයට හේතුව නම් රජුට හමුදා බලයක් නොතිබීමයි. වංශාධිපතිවරු න් සතුව හමුදා බලය තිබූ අතර රජු වංශාධිපති උන්ගෙන් ආරක්ෂාව පැතීය. ඒ වෙනුවට රජු තමාට හිමි ඉඩම් පවරා දීම සිදු කළේය.
- ජනතාව ද ඔවුන් සතුව තිබූ නිදහස් ඉඩම් විදේශ ආක්‍රමණ හමුවේ රජයේ ආරක්ෂාව නොලැබීම හේතුවෙන් වංශාධිපති වරයෙකුට භාරදී ආරක්ෂාව පැතීය.
- මෙම ක්‍රියාදාමය නිසා රජු දුවර්ල වී, වැසියන් ගැත්තන් බවට පත් වී, නිලධාරීන් දේපළ සහ බලය හිමි වංශාධිපතිවරුන් බවට පත් විය. මෙලෙස යුරෝපයේ සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රමය වැඩවසම් ක්‍රමයක් දක්වා පරිවතර්නය වීම සිදුවිය.

❖ වැඩවසම් ක්‍රමයේ මුලික ලක්ෂණ

- රජුට වඩා වංශාධිපති වරයා බලවත් විය.
- ඉඩම් හිමියා සහ ප්‍රවේණි දාසයා අතර සබඳතාවක් ගොඩ නැගීය.
- පුද්ගල බද්ධ පාලන ක්‍රමයක් නිර්මාණය විය.
- පන්ති භේදයක් නිර්මාණය විය.
- ස්වයංපෝෂිත ආර්ථික රටාවක් ගොඩ නැඟුණි.
- උප්පත්තිය අනුව සමාජ තරාතිරම තීරණය විය.

❖ වැඩවසම් ක්‍රමය බිඳ වැටීමට බලපෑ හේතු

- වෙළඳාම දියුණු වී නව වෙළඳ පන්තියක් බිහි වීම .
- වෙළඳාමේ දියුණුවත් සමග ප්‍රවේණි ක්‍රමය දුවර්ල වී නගර බිහි වීම.
- මුදල් භාවිතය ආරම්භ වීම.
- කුරුස යුද්ධය ඇතිවීම.
- ජාතික රාජ්‍යයන් බිහිවීම.
- ප්‍රවාහන ක්‍රම දියුණු වීම.
- ආගමික ප්‍රතිසංස්කරණ හේතුවෙන් ක්‍රිස්තියානි ආගම කොටස් වලට බෙදී යාම.
- ශාස්ත්‍රීය නවෝදය ඇති වීම.

මධ්‍යතන යුගය අවසාන කාලයේ දී පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාර වල පැවැති සාහිත්‍ය කලාව හා දශර්නය පිළිබඳ නැවත සොයා බැලීමෙ ප්‍රබල උනන්දුවක් යුරෝපය තුළ ඇති විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රීක රෝම ශිෂ්ටාචාර වල පැවති පැරණි කලා ශෛලීන් නැවත භාවිතයට ගැනීමත් සාහිත්‍ය හා දශර්නය ගැඹුරින් හැදෑරීමට යුරෝපීයයන් පෙළඹීමත් නිසා යුරෝපා සමාජයේ පුළුල් පරිවතර්නයක් සිදුවිය. ඉහත කී පැරණි ශිෂ්ටාචාර නැවත පණ ලැබුවේය යන අථර්යෙන් **පුනරුදය** යන වචනය භාවිතා කෙරේ. පුනරුද සමයේ යුරෝපයේ සෑම ක්ෂේත්‍රයකම පාහේ ඇති වූ වෙනස්කම් නිසා මධ්‍යතන යුගය අභාවයට යාමත් යුරෝපා ඉතිහාසයේ නූතන යුගය ආරම්භ වීමත් සිදුවිය.

❖ පුනරුදය යනු

පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාර වල යළි පිබිදීමයි. එනම් ක්‍රිස්තු වෂර් පහළොව සිට දහසය වන සියවස්වල යුරෝපයේ දේශපාලන, ආර්ථික, ආගමික, සාහිත්‍ය, කලාව, විද්‍යාව යනු ශ්‍රේෂ්ඨ වල ඇති ව ප්‍රබෝධය පුනරුදය ලෙස හැඳින්විය හැකිය.

❖ පුනරුදය ඇති වීමට බලපෑ හේතු

- ක්‍රි.ව 1453 දී කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතීන්ට යටත් වීම. (ආසන්නතම හේතුව)
- වෙළඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහිවීම.
- බුද්ධි ප්‍රබෝධය.
- පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම.

❖ යුරෝපයේ වෙනස් වීමට පුනරුදය බලපෑ ආකාරය



❖ ශාස්ත්‍රීය පුනරුදය යනු කුමක්ද?

- 15 වන සියවසේ යුරෝපයේ භාෂා ශාස්ත්‍රය, සාහිත්‍ය, චිත්‍ර කලාව, ප්‍රතිමා කලාව, ගෘහ නිර්මාණ, මානව වාදය යන අංශ වල ඇතිවූ නව ප්‍රබෝධයයි.
- යටපත් වී තිබූ ග්‍රීක රෝම ශිෂ්ටාචාරල අභාසය ලබමින් මෙම ක්ෂේත්‍ර නව පීවයක් ලැබීම මෙම යුගයේ ඇතිවූ ප්‍රධානතම වෙනස වේ. ශාස්ත්‍රිය නවෝදය මුලින්ම ආරම්භ වූයේ ඉතාලියේය.

❖ ශාස්ත්‍රිය නවෝදය මුලින්ම ආරම්භ වූයේ ඉතාලියේය එයට බලපෑ හේතු

- අනුග්‍රහය දැක්විය හැකි ධනවතුන් සිටීම.
- පැරණි ග්‍රීක රෝම ශිෂ්ඨාචාර වල මධ්‍යස්ථානය විම නිසා ඒවායේ අංග ලක්‍ෂණ ශේෂව තිබ්ම.
- කොන්ස්තන්තිනෝපල් නගරයේ සිට රැගෙන ගිය සම්භාව්‍ය කෘතිවැඩි ප්‍රමාණයක් ඉතාලියට ලැබීම.
- වැදගත් විශ්ව විද්‍යාල කිහිපයක් තිබීම.

❖ භාෂාව හා සාහිත්‍ය පුනර්ජීවනය

ග්‍රීක ලතින් භාෂා පුනරුදය

- මධ්‍යතන යුගයේදී යුරෝපා රටවල භාවිත වූයේ ගෝත්‍රික භාෂාවන්ය
- ආගමික කටයුතු වලදීහා නීතිය හැදෑරීමේදියම් ප්‍රමාණයකට ලතින් භාෂාව භාවිතා විය
- ග්‍රීක භාෂාව මල භාෂාවක තත්වයට වැටී තිබීම
- ග්‍රීක ලතින් භාෂා සම්භාව්‍ය භාෂා ලෙස සැලකේ
- කොන්ස්තන්තිනෝපලයේ රැස් කර තිබූ භාෂා දැනුම ඉතාලියට පැමිණිම තීරණාත්මක සිදුවීමකි
- පැරණිසම්භාව්‍ය කෘතිවැඩි ප්‍රමාණයක් පරිශීලනය කිරීම නිසා ග්‍රීක ලතින් භාෂාවල ප්‍රබෝධයක් ඇතිවිය
- ග්‍රීක ලතින් භාෂා ඉගෙනීම විලාසිතාවක් විය

❖ සාහිත්‍ය ප්‍රබෝධය

- ග්‍රීක ලතින් භාෂාවෙන් ලියවුනුපොත්පත් හැදෑරීම නිසා සාහිත්‍යයේ නව ප්‍රබෝධයක් ඇතිවිය
- ග්‍රීක නාට්‍ය පිළිබඳ බලවත් උනන්දුවක් ඇති වීම
- සාහිත්‍යමය වශයෙන් සේවය කල ගත්කතුවරු රැසක් බිහිවිය

| රට | ගත්කතුවරු |
|---|---|
| ඉතාලිය | අලිගියරි ඩාන්ටේ ෆැන්සිස් පෙට්රාක් ජියොවන්ති බොකෑෂියෝ |
| එංගලන්තය | තෝමස් මුවර් ප්‍රැන්සිස් බේකන් විලියම් ෂෙක්ස්පියර් |
| ප්‍රංශය | ඉරාස්මස් |

| | |
|---|---|
|  ඩාන්තේ<br>ඩිවිනා කොමිඩියා<br>ඉතාලි සාහිත්‍යයේ පියා |  බොකැෂියෝ<br>ඩි කැමරන් |
|  පෙට්රාක්<br>ලෝරාට සැහැලිකවි<br>මානව වාදයේ පියා |  තෝමස් මුවර්<br>යුටෝපියා |
|  ෆැන්සිස් බේකන්<br>ඉංග්‍රීසි සාහිත්‍යයේ නව උදාවේ පහන් තරුව |  ඉරාස්මස්<br>මෝඩයන්ට ප්‍රසංසා කිරීම |

❖ මානව වාදය

පුනරුදයට පෙර සියල්ලටම වඩා දෙවියන් උතුම්ය යන සංකල්පය පැවතුණි. එය **දේවවරම්වාදය** ලෙස හැදින්වේ. එහෙත් පුනරුද සමයේදි මානවයා උතුම්ය යන සංකල්පය ඉස්මතු විය. එය **මානවවාදය** ලෙස හැදින්වේ.

❖ කලා ශිල්ප

පුනරුද සමයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම්

| පුනරුද සමයට පෙර කලා ශිල්ප වල ස්වභාවය | පුනරුද සමයේ කලා ශිල්ප වල ස්වභාවය |
|---|---|
| • සියළුම ශිල්පීන් සංවිධානය වි සිටියේ ශ්‍රේණි වශයෙනි<br>• නිර්මාණ ශ්‍රේණියේ නිමින් හැදින්විම<br>• නිදහස් හා ස්වාධිනව නිර්මාණ ඉදිරිපත්කිරීමට ඉඩක් නොලැබීම<br>• මධ්‍යතන යුගයේ කලාශිල්ප හැඩගැසී තිබුණේ පල්ලියේ අනුග්‍රහය මත ආගමික චින්තනය මතය<br>• කලාවේ පරමාර්ථය ආගමික භක්තිය ජනිත කරවිම | • කලාකරුවන්ට අනුග්‍රහ දැක්විමට ලෞකික රසවින්දනය අගයකරන ධනවතුන් ඉදිරිපත්විම<br>• ස්වාධිනව තම දක්ෂතා ඉස්මතු කර නිර්මාණ බිහිවිය<br>• නිර්මාණ කතෘගේ නමින් එළි දැක්විම<br>• ආගමික සිතුවිලි වලට මුල්තැනදීම වෙනුවට පෞද්ගලිකත්වය ඉස්මතු කරන ලෞකික රසවින්දනයට මුල් තැනදීම |

| ක්ෂේත්‍රය | කලා කරුවන් | නිර්මාණ |
|---|---|---|
| චිත්‍ර |  ලියනාඩෝ ඩාවින්චි |  අන්තිම භෝජන සංග්‍රහය  මොනාලිසා  කන්‍යා මරියතුමිය දේවදූතයාට කළ ප්‍රකාශය |
| |  මයිකල් ආන්ජලෝ |  අවසාන විනිශ්චය  ආදම්ගේ චිත්‍රය  සිස්ටයින් දේවමන්දිරයේ සිවිලිමේ සිතුවම් |
| |  රෆායල් සැන්ඩි |  ඇතැන්ස්හි පාසල  කන්‍යා මරියතුමිය හා ජේසු බිලින්දා |
| මූර්ති |  මයිකල් ආන්ජලෝ |  ඩේවිඩ් ( දාවිත්)  පියෙටා  මෝසස් |
| |  ඩොනෙටෙලෝ |  ශාන්ත ජෝර්ජ් ප්‍රතිමාව  ඩේවිඩ් |

| | | |
|---|---|---|
| ගෘහ නිර්මාණ ශිල්පය | බ්‍රමන්තේ | ශාන්ත පීතර බැසිලිකාව නිර්මාණකරනය ආරම්භ කිරීම |
| | මයිකල් ආන්ජිලෝ |  ශාන්ත පීතර බැසිලිකාව |
| | රෆායල් සැන්ඩි |  ගුලියානෝ ඩි මෙඩිචිගේ සොහොන |

❖ මූර්ති කලාව

මූර්ති කලාවේ විශේෂ ලක්ෂණ

- ග්‍රීක රෝම කලාවන්ට අනුව ප්‍රතිමා නෙලීම
- කිරිගරුඬින් ප්‍රතිමා නෙලීම
- ස්වභාවිකත්වය විදහාදක්වන ලෙෂ ප්‍රතිමා  නෙලිම
- ශ්‍රේෂ්ඨතම ප්‍රතිමා ශිල්පියා මයිකල් ආන්ජලෝය

❖ ගෘහ නිර්මාණ ශිල්පය වෙනස්කම්

| මධ්‍යතන යුගය | පුනරුද යුගය |
|---|---|
| • ගොතික් ශෛලිය කැපී පෙනේ<br>• අඳුරු චාම් ස්වරූපයක් උසුලයි<br>• උල්කේතු ආකාරයේ ආරුක්කු හා උස් පිරමිඩ ආකාරයේ කුළුණු<br>• සුවපහසු මන්දිර මෙකල ඉදි නොවීය | • රෝම ශෛලිය කැපී පෙනේ<br>• අලංකාර නිර්මාණ වේ<br>• වටකුරු ආරුක්කු උස් වූ කුළුණු විශාල අර්ධ ගෝලාකාර ශිඛර<br>• දේවස්ථාන වලට අමතරව රෝම වරුන් අනුගමනය කරමින් ඉතා සුවපහසු මන්දිර තැනිම |

❖ විද්‍යාත්මක දියුණුව

| ක්ෂේත්‍රය | විශ්වය පිළිබඳ මත ඉදිරිපත් කළ විද්‍යාඥයින් | රට | මතය |
|---|---|---|---|
| විද්‍යාත්මක ක්ෂේත්‍රය | නිකලස් කොපරනිකස් | පෝලන්තය | පෘථිවිය ගෝලාකාර බවත් අනෙකුත් ග්‍රහයන් සූයර්යා වටා පරිභ්‍රමණය වන බවත් සොයා ගත්තේය.<br>ඔහු නූතන තාරකා විද්‍යාවේ පියා ලෙස හැඳින්වේ. |

| | | | |
|---|---|---|---|
| | අයිසෙක් නිව්ටන් | එංගලන්තය | ගුරුත්වාකෂර්ණ නියමය සොයාගත්තේය |
| | ජොහැන්නස් කෙප්ලර් | ජමර්නිය | සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූයර්යා වටා ඉලිප්සාකාර ව ගමන් ගන්නා බව සොයා ගන්නා ලදී. |
| | ගැලීලියෝ ගැලිලි | ඉතාලිය | දුරදක්න නිපදවීම.<br>එමගින් ආකාශවස්තු නිරීක්ෂණ කර චන්ද්‍ර ආවට, බ්‍රහස්පති ග්‍රහයාගේ උප ග්‍රහයින් ඇති බව සොයා ගත්තේය.<br>ඔහු අත්හදාබැලීමේ පියා ලෙස හැඳින් වේ. |
| වෛද්‍ය විද්‍යාව | විලියම් හාවේ | එංගලන්ත | මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතියේ මූළු ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු සොයා ගත්තේය. |
| | ෛවෙද්‍ය පැරසල්සස් | ස්විට්සලර්න්තය | රෝග සෑදීමට හේතු ඒවාට ප්‍රතිකාර අත්හදා බැලීය තන ඖෂධ විද්‍යාව කෙරෙහිද රෝග චිකිත්සක ක්‍රම කෙරෙහිද බලපෑමක් ඇති කළේය |
| | මයිකල් | ස්විට්සලර්න්තය | රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිටවී ගොස්පෙනහලු මගින් පිරිසිදු වී යළිත් හදවතට පැමිණ ශරීරය පුරාම විසිරී යාම පිළිබඳව තොරතුරු සොයා ගත්තේය. |
| | ජොහැන්ස් ගුටෙන්බර් | ජමර්නිය | මුද්‍රණ යන්ත්‍රය නිපදවීය. |

❖ පුනරුදයේ දේශපාලන නවෝදය

- පුනරුද සමයේ යුරෝපයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වැදගත්ම නවෝදය **ජාතික රාජ්‍ය** බිහි වීමයි.
- ජාතික රාජ්‍යයක් යනු,

  නිශ්චිත දේශසීමාවකින් යුත්, නිශ්චිත ජනගහනයක් සහිත, සමාන භාෂාවක් කතා කරන, සමාන සංස්කෘතියකින් යුක්ත රජු වටා බලය ඒකරාශි වී ගොඩනැගුණු දේශපාලන ඒකකයකි.

✓ ජාතික රාජ්‍යයන් ඇති වීමට බලපෑ හේතු

- වෙළෙඳාමයේ සිදුවූ දියුණුව.
- රජවරුන් බලවත් වීම.
- මධ්‍යම පන්තියක් බිහි වීම.

✓ ජාතික රාජ්‍යයක ලක්ෂණ

- රජු බලවත් වීම.
- රජුට ස්ථිර හමුදාවක් ලැබීම
- පාරම්පරික රදළ පැලැන්තිය යටපත් වී ගොස් මධ්‍යම පංතියකින් යුතු නව ධනවතුන් බිහි වීම
- නව රාජ්‍ය නිධාරීන් පිරිසක් බිහිවීම
- පොදු නීති පද්ධතියක් සහ පොදු බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වීම
- ජාතික රාජ්‍යයන් ධනවත් වීමේ අභිලාෂයෙන් යුරෝපයෙන් පිටත වෙළෙඳපොළ සෙවීම හා යටත්විජිත ඇති කර ගැනීමට උනන්දු වීම

- ✓ මුලින්ම නැගී ආ ජාතික රාජ්‍යයන්
  - ස්පාඤ්ඤ
  - ප්‍රංශ
  - එංගලන්තය

❖ යුරෝපයේ ආර්ථික නවෝදය

- ✓ මාධ්‍යකාලීන අවධියේ ක්‍රියාත්මකව පැවතියේ ප්‍රවේණි කේන්ද්‍ර කොට ගත් ස්වයංපෝෂිත කෘෂිකාර්මික ආර්ථික රටාව පරිහානියට පත්වීම.
- ✓ වෙළඳ කටයුතු පුළුල් වීම. දේශ ගවේෂණ වල ප්‍රතිඵලයක් වශයෙන් නව මුහුදු මාර්ග සොයාගෙන යුරෝපා ජාතීන් පෙරදිගට සහ නව ලෝකයට ළඟා වීම නිසා එම ප්‍රදේශවල තිබූ වෙළෙඳ ද්‍රව්‍ය යුරෝපයට ගලා එන්නට විය.
- ✓ කුළුබඩු, රන්, රිදී, මුතු, මැණික්, සේද රෙදි, ඇතුන්, ඇත්දළ, බුමුතුරුණු යනාදීය එහිදී ප්‍රධාන විය.
- ✓ වෙළඳ කටයුතු පුළුල් වීමත් සමග මුදල් භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. මුදල් නෝට්ටු භාවිතය ප්‍රචලිත විය.
- ✓ ව්‍යාපාරිකයන්ට ව්‍යාපාරික කටයුතු වලට අවශ්‍ය ණය ආදිය ලබාගැනීමට බැංකු කටයුතු ආරම්භ විය.
- ✓ වෙළඳ කටයුතු බහුල වීමත් සමග නගර බිහි වීමක් දක්නට ලැබුණේය. ඕලන්දයේ Amsterdam, පෘතුගාලයේ ලිස්බන්, ස්පාඤ්ඤයේ මැඩ්රිච් ප්‍රංශයේ පැරිස් වැනි වතර්මානයේ පවා දියුණුව පවතින නගර බිහි වූයේ පුනරුද අවධියේය.

❖ දේශ ගවේෂණය හෙවත් නව මුහුදු මාර්ග සොයා යාම

- දේශ ගවේෂණය යනු,
  යුරෝපා ජාතික නව මුහුදු මාර්ග සොයා ගනිමින්එතෙක් හඳුනා නොගත් රටවල් සොයා යාම දේශ ගවේෂණය ලෙස හඳුන්වයි.

- දේශ ගවේෂණය ඇතිවීම සඳහා බලපෑ හේතු
  - ✓ ක්‍රිස්තු වර්ෂ 1453 දී කොන්ස්තන්තිනොපල් නගරය තුකරීවරුන්ට යටත්වීම හා යුරොපියන්ගේ සම්ප්‍රදායික වෙළෙඳ මාර්ග අවහිර විම.
  - ✓ නවවිද්‍යාත්මක සොයා ගැනීම.
  - ✓ ජාතික රාජ්‍යයන් දේශ ගවේෂණය සඳහා රාජ්‍ය අනුග්‍රහය දැක්වීම.
  - ✓ මුස්ලිම්වරුන් සතුව පෙරදිග වෙළෙඳ ආධිපත්‍යය යුරොපියන් සතු කොට ගැනීමෙ අපේක්ෂාව
- දේශ ගවේෂණ සඳහා මුලින්ම උනන්දුවක් දැක්වූ රටවල්
  - ✓ පෘතුගාලය
  - ✓ ස්පාඤ්ඤය
- දේශ ගවේෂණ සඳහා අනුග්‍රහය දැක්වූ අය
  - ✓ පෘතුගාලයේ හෙන්රි කුමාරය
  - ✓ ස්පාඤ්ඤයේ ෆර්ඩිනන්ඩ් රජු හා ඉසබෙලා රැජින

- දේශ ගවේෂණයේ යෙදුණු දේශ ගවේෂකයන් හා ඔවුන් සොයාගත් ප්‍රදේශ හා රටවල්

| වර්ෂය | දේශ ගවේෂකයන් | සොයාගත් ප්‍රදේශ හා රටවල් |
|---|---|---|
| 1488 | බර්තොලමියු ඩයස් | සුභපැතුම් තුඩුව |
| 1498 | වස්කොද ගමා | ඉන්දියාවේ කැලිකට් වරාය |
| 1500 | කබ්රාල් | බ්‍රසීලිය |
| 1492 | ක්‍රිස්ටෝපර් කොලොම්බස් | කැරිබියන් දූපත්/ය හිස්පැනියෝලාව |
| 1519 | ෆර්ඩිනන්ඩ් මැගලන් | පිලිපීන දූපත් |
| | ඇමරිගෝ වෙස්පුචි | ඇමරිකාව |
| 1497 | කැබේ සහෝදරයෝ | කැනඩාව |

❖ පුනරුදයේ ගෝලීය ප්‍රවනතා

- යුරෝපයේ වෙළඳාම දියුණු වූ නිසා සෙසු රටවල් සමඟ දේශපාලන, සමාජ හා සංස්කෘතිකමය වශයෙන් සබඳතා ගොඩනැගීම.
- මුද්‍රණ කර්මාන්තය දියුණු වීම නිසා ලෝකයේ අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු වීම.
- යුරෝපීයන්ගේ යටත් විජිතවල ඔවුන්ගේ ආගම ව්‍යාප්ත කිරීම.
- දේවස්ථාන, ගොඩනැගිලි ඉදිකිරීම යුරෝපයේ වාස්තු විද්‍යාව හා කලා ශිල්ප උපයෝගී කරගනිමින් සිදුකෙරිණි.

❖ පුනරුදය ලංකාව කෙරෙහි බලපෑම ලංකාව කෙරෙහි බලපෑම

**<u>දේශපාලන</u>**

- උඩරට රාජධානිය යටත් වන තෙක් පැවති සාම්ප්‍රදායික රාජාණ්ඩු ක්‍රමය අහෝසි වී ඉංග්‍රීසියෙන් හඳුන්වා දෙන ලද පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වීම.
- උඩරට රාජධානි සමයේ සිටි අදිකාරම්වරු, දිසාවේවරු, මොහොට්ටාලවරු, කෝරාල වරුන් වැනි සාම්ප්‍රදායික නිලධාරී පන්තිය වෙනුවට අලුත් පාලන ක්‍රමයට ගැලපෙන නව නිලධාරී පන්තියක් බිහි වීම
- ලන්දේසීන්ගේ පාලන කාලයේදී මෙරටට රෝම ලන්දේසි නීතිය හඳුන්වා දීම.

**<u>ආර්ථික</u>**

- ලන්දේසීන් මෙරට කුරුඳු වගා ආරම්භ කිරීම
- බ්‍රිතාන්‍යයන් කෝපි, කොකෝවා, සිංකෝනා, තේ, රබර්, පොල් වැනි වතු බෝග වගාවන් ආරම්භ කිරීම.
- ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය බිඳ වැටී ආනයන අපනයන පදනම් කර ආර්ථික රටාවක් බිහි වීම
- මුදල් භාවිතය ප්‍රචලිත වීම.
- දුම්රිය මාර්ග මහා මාර්ග පද්ධතිය දියුණු වීම
- කොළඹ ත්‍රිකුණාමලය ගාල්ල වැනි වෙළඳ නගර බිහි වීම නිසා නව ධනෝපායන මාර්ග වලින් මුදල් උපයාගත් මධ්‍යම පන්තියක් බිහි විය

**<u>සමාජ සංස්කෘතික ලක්ෂණ</u>**

- මුද්‍රණ කර්මාන්තයේ දියුණුවත් සමග පොත්පත්, සඟරා, පුවත්පත් ආදිය ප්‍රකාශයට පත් වීම නිසා සමාජයේ දැනුවත්භාවය ඉහළ ගොස් යුරෝපීය චින්තනයත් යුරෝපීය සාහිත්‍යයත් මෙරට ලැබුණි.
- බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ලාංකිකයන් යුරෝපා රටවලට ගොස් අධ්‍යාපනයේ නිරත වීම නිසා එරට යම්යම් සංස්කෘතික ලක්ෂණ මෙරටට ආගමණය විය.
- පෘතුගීසි ජාතිකයෝ මෙරට රෝමානු කතෝලික ආගම ස්ථාපිත කළ අතර ලන්දේසි රෙපරමාදු ආගම ව්‍යාප්ත කළහ.
- බටහිර අධ්‍යාපන ක්‍රමය මෙරට ප්‍රචලිත විය.
- ආහාරපාන, ඇඳුම් පැළඳුම්, සිරිත් විරිත්, සංගීතය, නැටුම් කලාවන් යනාදී යුරෝපීය සංස්කෘතික ලක්ෂණ මෙරට රෝපණය විය.
- යුරෝපීයයන්ට අයත් පෙළපත් නාමයන් ලාංකික සමාජයට එක් විය.

## අභ්‍යාස

**<u>1 වන කොටස</u>**

1. රෝම ශිෂ්ඨාචාරය බිඳ වැටෙනු ලැබුවේ කිනම් සියවසකද?
2. මධ්‍යතන යුගයේ අවසානයේ යුරෝපයේ ඉතා දියුණුවට පත්ව තිබූ වෙළෙඳ නගරය කුමක්ද?
3. 1453 වර්ෂයේ දී මුස්ලිම් භක්තිකයන් විසින් අත්පත් කරගත් යුරෝපා නගරය කුමක්ද?
4. පුනරුද සමයේ දී ග්‍රීක රෝම සංස්කෘතිය යළි පිබිදීමත් සමග ප්‍රචලිත වූ භාෂාවන් මොනවාද?
5. යුරෝපය තුළ පුනරුදය ආරම්භ වූ රාජ්‍ය කුමක්ද?
6. චිත්‍ර කලා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉතාලියෙහි ප්‍රසිද්ධියට පත් නගරය කුමක්ද?
7. පුනරුද සමයේ මයිකල් ආන්ජලෝ විසින් කිරිගරුඬ පාෂාණයෙන් ප්‍රභූ පුද්ගලයකුගේ මූර්තියක් නිර්මාණය කරන ලදී. ඒ කවරෙක්ද?
8. මොනාලිසා, අන්තිම භෝජන සංග්‍රහය යන චිත්‍ර කවරකු විසින් සිතුවම් කරනු ලැබුවේ ද?
9. රෝමයේ සිස්ටයින් දේවස්ථානය සිවිලිමේ චිත්‍ර ඇඳි පුනරුද සමයේ චිත්‍ර ශිල්පියා කවරෙක්ද?
10. අවසාන විනිශ්චය, ආදම්ගේ චිත්‍රය යන චිත්‍ර කවර ශිල්පියකු විසින් සිතුවම් කර ඇතිද?
11. පුනරුද සමයේ දී පිළිම නෙළීමට යොදා ගනු ලැබුයේ කුමන පාෂාණ වර්ගය ද?
12. ඉතාලියේ කලාත්මක කටයුතුවලට උරදුන් ධනවත් පවුල කුමන නමකින් හඳුන්වයි ද?
13. පුනරුද සමයේ දී ඩිවිනා කොමිඩියා නම් ග්‍රන්ථය රචනා කරනු ලැබුවේ කවරෙක්ද?
14. පුනරුද සමයේ දී ලෝරාට සැහැලි කවි නම් ග්‍රන්ථය රචනා කළ පුද්ගලයා කවුද?
15. ගුරුත්වාකෂර්ණ බලය සොයා ගනු ලැබුයේ කවරෙක් ද?
16. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූයර්යා වටා ඉලිප්සාකාර ගමන් මාර්ග ගමන් ගන්නා බව සොයා ගනු ලැබුවේ කවරෙක්ද?
17. දූරදක්නය, බ්‍රහස්පති ග්‍රහයාගේ උප ග්‍රහයන් සොයාගත්තේ කවුරුන්ද?
18. පෘතුවිය ගෝලාකාර බව, අනිකුත් ග්‍රහයන් සූයර්යා වටා පරිභ්‍රමණය වන සොයාගනු ලැබුවේ කවරෙක්ද?
19. නූතන තාරකා විද්‍යාවේ පියා කවුද?
20. අත්හදා බැලීමෙ පියා වශයෙන් හඳුන්වන්නේ කවුද?
21. මිනිස් රුධිර සංසරණ පද්ධතිය පිළිබඳව වැදගත් තොරතුරු අනාවරණය කර වූයේ කවරෙක්ද?
22. රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිටවී පෙනහළු මගින් පිරිසිදු වී යළිත් හදවත පැමිණෙන බව හඳුනා ගත් පුද්ගලයා කවුද?
23. මුද්‍රණ යන්ත්‍රය නිපදවූයේ කවරෙක්ද?
24. යුරෝපා ජාතීන් නව මුහුදු මාර්ග සෙවීමට පෙළඹුණේ කුමන හේතුවක් නිසාද?
25. දේශ ගවේෂණ කටයුතු සඳහා විශාල දායකත්වයක් දැක්වූ පෘතුගාලයේ පාලකයා කවුද?
26. අප්‍රිකාවෙන් කුණාටු තුඩුව දක්වා ගමන් කළ පෘතුගාල දේශ ගවේශකයා කවරෙක්ද?
27. කුණාටු තුඩුව සුබපැතීමේ තුඩුව නමින් නම් කල රජු කවරෙක්ද?
28. ඉන්දියාවේ කැලිකට් වරාය දක්වා ගමන් කළ පෘතුගාල දේශ ගවේශකයා කවරෙක්ද?
29. බටහිර ඉන්දීය දූපත් සොයා ගනු ලැබුවේ කවරෙක් ද?

30. දේශ ගවේෂණ කටයුතු සඳහා විශාල දායකත්වයක් දැක් වූ ස්පාඤ්ඤ පාලකයන් කවරුන්ද?
31. නවලෝකය හෙවත් ඇමරිකාව සොයා ගනු ලැබූයේ කවුරුන්ද?
32. කැනඩාව සොයා ගනු ලැබුවේ කවුරුන්ද?
33. පිලිපීනය සොයා ගනු ලැබුවේ කවුරුන්ද?

## 11 වන කොටස

1. යුරෝපයේ පුනරුදය ඇති වීම සඳහා බලපාන ලද සාධක හතරක් නම් කරන්න.
2. දොලොස්වන සියවසේ යුරෝපයේ දියුණුවට පත්ව තිබූ වෙළඳ නගර තුනක් නම් කරන්න.
3. පුනරුද සමයේ ආරම්භ වූ අධ්‍යාපන ක්‍රමය තුළ යුරෝපයේ ඉගැන්වූ ප්‍රධාන විෂයන් හතරක් නම් කරන්න.
4. පුනරුද සමයේදී කතෝලික සභාව විවේචනය කරන ලද දාශර්නිකයින් හතරදෙනෙකු නම් කරන්න.
5. පුනරුදය හේතු කොටගෙන යුරෝපයේ විවිධ ක්ෂේත්‍ර වල නවෝදයක් සිදුවිය. එසේ නවෝදයක් ඇති වූ ක්ෂේත්‍ර හතරක් නම් කරන්න.
6. පුනරුදය මුලින්ම ඉතාලියෙන් ආරම්භ වීමට බලපෑ හේතු හතරක් ලියන්න.
7. පුනරුද සමයට පෙර හා පුනරුද සමයේ දී කලා ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් හතරක් ලියන්න.
8. පුනරුද සමයේ චිත්‍ර කලාවේ ප්‍රබෝධයට උර දුන් ශිල්පීන් හඳුන්වා ඔවුන්ගේ නිර්මාණ දෙක බැගින් ලියන්න.
9. මූර්ති කලාවේ නියුතු ශිල්පීන් දක්වා ඔවුන්ගේ නිර්මාණ දෙක බැගින් ලියන්න.
10. ගෘහ නිර්මාණ ශිල්පයෙහි පුනරුදය ට පෙර සහ පසු ඇති වූ වෙනස්කම් සටහන් කරන්න.
11. මානව වාදය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?
12. සාහිත්‍ය සේවයේ ප්‍රබෝධය සඳහා කටයුතු කළ ගත් කතුවරු හතර දෙනෙක් ලියන්න.
13. පුනරුද සමයේ දී යුරෝපයෙහි දේශපාලන නවෝදයක් ඇති විය. එහි මූලික ලක්ෂණ හතරක් දක්වන්න.
14. පුනරුද සමයේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ නවෝදය කරුණු හතරකින් දක්වන්න.
15. දේශ ගවේෂණය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?
16. දේශ ගවේෂණය ඇතිවීම සඳහා බලපෑ හේතු හතරක් ලියන්න.
17. දේශ ගවේෂණ සඳහා රාජ්‍ය අනුග්‍රහය දැක්වූ තිදෙනකු නම් කරන්න.
18. පුනරුදයේ ගෝලීය ප්‍රවණතා හතරක් ලියන්න.
19. පුනරුදය ලංකාවේ පහත ක්ෂේත්‍ර සඳහා ඇති කළ බලපෑම් හතර බැගින් ලියන්න.
    a ) දේශපාලන ක්ෂේත්‍රය b) ආර්ථික ක්ෂේත්‍රය c) සමාජ සහ සංස්කෘතික

## 111 වන කොටස

1. පුනරුදය ඇතිවීම සඳහා බලපෑ හේතු තුනක් විස්තර කරන්න.
2. පුනරුදයේ හේතුවෙන් චිත්‍ර කලාවේ ඇති වූ දියුණුව කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.
3. පුනරුදය හේතුවෙන් ප්‍රතිමා කලාවේ සහ ගෘහ නිර්මාණ ශිල්පයෙහි ඇති ඇති වූ ප්‍රබෝධය විස්තර කරන්න.
4. පුනරුදය හේතුවෙන් යුරෝපයේ දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ නවෝදය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.
5. පුනරුදය නිසා යුරෝපයේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ නවෝදය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න.
6. දේශ ගවේෂණ ඇතිවීම සඳහා බලපෑ හේතු තුනක් විස්තර කරන්න.
7. පුනරුදය ලංකාවේ දේශපාලන, ආර්ථික සහ සමාජ සංස්කෘතික අංශයන්ට කළ බලපෑම විග්‍රහ කරන්න.

සැකසුම - අසංකා උපුලී ජයසුන්දර - විහාරමහාදේවි බාලිකා විද්‍යාලය - කිරිබත්ගොඩ

# ඉතිහාසය

**10 ශ්‍රේණිය**

## ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය

❖ පෙරදිගට පැමිණි බටහිර ජාතීන් හා ඔවුන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථාන

| බටහිර ජාතීන් | රට | පෙරදිග වෙළඳ මධ්‍යස්ථාන |
|---|---|---|
| පෘතුගීසීන් | පෘතුගාලය | ගෝව |
| ලන්දේසීන් | ඕලන්දය (නෙදර්ලන්තය) | බතාවිය (ජාවා දූපතහි) |
| ඉංග්‍රීසීන් | බ්‍රිතාන්‍ය | **මදුරාසිය**, කල්ලටාව, බොම්බාය |
| ප්‍රංශ | ප්‍රංශය | **පොණ්ඩිචෙරි**, චන්ද්‍රනගර්, කරිකාල් |

### පෘතුගීසීන් ආසියාවට පැමිණීම

ඈත අතීතයේ සිටම ආසියාව හා යුරෝපය අතර වෙළඳ සබඳතා පැවැත්වූ ප්‍රධාන මාර්ග තුනකි. එනම්,

1) කොන්ස්තන්තිනෝපල් නගරයේ සිට පර්සියාව මධ්‍ය ආසියාව හරහා චීනය දක්වා වැටී තිබූ මාර්ගය හෙවත් සේද මාවත
2) කොන්ස්තන්තිනෝපලයේ සිට මධ්‍යධරණී මුහුද ඔස්සේ මිසරය රතු මුහුද හරහා ඉන්දියානු සාගරයට පැමිණි මාර්ගය
3) කොන්ස්තන්තිනෝපලයේ සිට බැග්ඩෑග් පර්සියන් බොක්ක හරහා ඉන්දියාවේ බටහිර වෙරළට පැමිණි මාර්ගය

ඉහත වෙළඳ මාර්ග තුනම කොන්ස්තන්තිනෝපල් නගරය හරහා සම්බන්ධ වී පැවති බැවින් මෙම නගරය පෙර අපර දෙදිග ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයයි.

➢ **කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් යටත් කර ගැනීම**

ක්‍රි.ව. 1453 කොන්ස්තන්තිනෝපල් නගරය මුස්ලිම්වරුන් වන තුර්කීන් යටත් කර ගැනීම හේතුවෙන් මධ්‍යතන යුගය වන විට ආසියාවේ වෙළඳාමේ ඒකාධිකාරිය මුස්ලිම්වරුන් සතු විය.

**කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් යටත් කර ගැනීමෙන් යුරෝපීයන් මුහුණ දුන් ගැටලු**

- කුළු බඩු වල මිල ඉහළ යාම
- භාණ්ඩ හිඟයක් ඇති වීම
- කලට වේලාවට භාණ්ඩ නොලැබීම

මේ හේතුවෙන් යුරෝපීයන් පෙරදිගට පැමිණීමට තව මාර්ග සෙවීමට පෙළඹුනි. මේ අතරින් පෙරමුණ ගත්තේ පෘතුගාලයයි.

➢ **පෘතුගාලයේ නාවික ගෝත්‍රික රජු දේශ ගවේෂණ කටයුතු සඳහා ගත් ක්‍රියාමාර්ග**

- නාවුක විද්‍යාලයක් පවත්වාගෙන යාම.
  එහි නාවික ශිල්පය, සිතියම් විද්‍යාව, තාර්ක ශාස්ත්‍රය වැනි විෂයන් ඉගැන්විය.
- නාවුක කටයුතු සඳහා විශාල නැව් තනාදීම.
- වෙනත් ආධාර සැපයීම.

➢ **වස්කෝද ගාමා ඉන්දියාවට පැමිණීම**

පෙරදිගට මුලින්ම පැමිණියේ පෘතුගීසි ජාතික වස්කෝද ගාමාය. 1498 ඉන්දියාවේ කාලිකට් වරායට පැමිණියේය.

වස්කෝද ගාමාගේ ප්‍රකාශය **"ක්‍රිස්තියානීන් සහ කුළු බඩු සොයා අපි මෙහි පැමිණියෙමු"** මෙම ප්‍රකාශයේ අරමුණ නම් ආගමික හා ආර්ථික අරමුණුය. 1505 දී පෘතුගාලයේ රජු විසින් පෙරදිග පෘතුගීසී ප්‍රතිරාජයා වශයෙන් ෆ්‍රැන්සිස්කු ද අල්මේද පත් කර එවන ලදි.

යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු,

- ආර්ථික වාසි ලබා ගැනීම.
- ආගම ප්‍රචාරය කිරීම.
- ජාත්‍යන්තර කීර්තිය දිනා ගැනීම.
- ඉස්ලාම් ආගම පැතිර යාම වැලැක්වීම.

පෘතුගීසීන් පැමිණි අවධියේ ලංකාවේ දේශපාලන තත්වය පෘතුගීසීන් හඳුන්වා දීම **සෙයිලන්** වශයෙනි. ලංකාව ඉතා හොඳ තත්වයේ කුරුඳු නිපදවන රටක් ලෙස පෘතුගීසීන් දැන සිටියේය.
1505 ලොරෙන්සෝද අල්මේදා ඇතුළු පෘතුගීසි නැව් කණ්ඩායම ලංකාවට පැමිණෙන විට ලංකාව රාජධානි තුනකට බෙදී තිබුණි.

- ✓ කෝට්ටේ 8 වන වීර පරාක්‍රමබාහු රජු
- ✓ මහනුවර සේනා සම්මත වික්‍රමබාහු රජු
- ✓ යාපනය පරරාජසෙකරම් රජු

පෘතුගීසීන් කොළඹට පැමිණි අවස්ථාවේදී ඔවුන්ගේ නියෝජිතයන් රජු හමු වීමට කැඳවාගෙන යන විට කොළඹ සිට වට වංගු සහිත දුර මාර්ගයක් ඔස්සේ ඔවුන් කැඳවාගෙන යාම නිසා "පරංගියා කෝට්ටේ ගියා වාගේ" යැයි ප්‍රස්ථා පිරුලක් ඇති විය.

## ➢ විජයබා කොල්ලය 1521

පෘතුගීසීන්ට මෙරට පාලන කටයුතු වලට ඇඟිලි ගැසීමට අවස්ථාව උදා වූ පලමු අවස්ථාවයි.
6 වන විජයබාහු රජු සිය දෙවන බිසව වන කීරවැල්ලේ බිසවගේ පුත් දේවරාජ කුමාරයාට රජකම ලබාදීමට කටයුතු කරන බව දැන ගත් පළමු බිසවගේ දරුවන් තිදෙනා පිය රජු මරා කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදාගෙන පාලනය කිරීම බිජයබා කොල්ලයයි.

- ✓ කෝට්ටේ 7 වන බුවනෙකබාහු රජු
- ✓ සීතාවක මායාදුන්නේ රජු
- ✓ රයිගම රයිගම බණ්ඩාර රජු

විජයබා කොල්ලයේ මහ මොලකරු මායාදුන්නේ කුමරුය. මීට සහාය දුන්නේ උඩරට රාජධානියේ ජයවීර බණ්ඩාර රජුය. 7 වන විජයබාහු රජු මරණයට පත් කළේ සලමාන් නැමැත්තෙකි.

## ❖ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පලාත්වල පෘතුගීසි බල ව්‍යාප්තිය

- කෝට්ටේ 7 වන බුවනෙකබාහු රජු සීතාවක මායාදුන්නේ රජුගෙන් ආරක්ෂා වීමට පෘතුගීසින්ගේ සහය පැතීය.
- 7 වන බුවනෙකබාහු රජුගේ දියණිය සමුද්‍ර දේවිය වන අතර බෑණා වූයේ වීදිය බණ්ඩාරය.
- 7 වන බුවනෙකබාහු රජුට අනාගත උරුමය පැවරීමට පුතෙකු නොසිටි බැවින් තම දියණියගේ පුතා වන ධර්මපාල කුමරුට කෝට්ටේ අනාගත උරුමය පැවරීය.
- 7 වන බුවනෙකබාහු රජු පෘතුගීසි සහය පැතීම හේතුවෙන් මුස්ලිම් වරුන් සීතාවක මායාදුන්නේ රජු හා එක් විය. එහිදී මායාදුන්නේ රජු පෘතුගීසි විරෝධී පාලකයෙකු වූ කැලිකට් හි සැමොරින්ගේ සහය පැතීය. නමුත් පෘතුගීසින්ගේ නාවික ශක්තිය හේතුවෙන් එය අසාර්ථක විය.
- බුවනෙකබාහු රජු ජීවත්ව සිටියදී තම මුණුබුරු ධර්මපාල කුමරුගේ පිළිරුවක් පෘතුගාලයට යවා එරට රජු අතින් ඔටුනු පැළඳ වීමට කටයුතු කලේය.
- 1550 දෙසැම්බර් 29 දින 7 වන බුවනෙකබාහු රජු මියයෑමත් සමඟ ධර්මපාල කුමරු කෝට්ටේ පාලකයා බවට පත් විය.
- ධර්මපාල කුමරුට පෘතුගීසි රැකවරණය ලැබුණු අතර ධර්මපාල කුමරු පෘතුගීසි රූකඩයක් බවට පත් විය.
- ධර්මපාල කුමරු කතෝලික ආගම වැළඳ දෙන් ජුවන් ධර්මපාල නමින් බෞතීස්ම ලැබීය.
- රජු කතෝලික ආගම වැළඳගෙන පෘතුගීසි පක්ෂ ක්‍රියා කලාපයක් අනුගමනය කිරීම නිසා ජනතා පක්ෂපාතීත්වය අහිමි වූ අතර දන්ත ධාතූන් වහන්සේ ද ආරක්ෂාව පතා සීතාවකට වැඩම වීය.
- 1551 සිට 1597 දක්වා කෝට්ටේ පාලකයා ධර්මපාල කුමරුය. 1957 ධර්මපාල රජුගේ මරණින් පසු තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජ්‍ය පෘතුගීසින්ට හිමි විය.

## ➢ 7 වන බුවනෙකබාහු රජු හා පෘතුගීසීන් අතර මතභේද ඇති වීමට හේතු

- 7 වන බුවනෙකබාහු රජු කතෝලික ආගම වැළඳ නොගැනීම.
- පෘතුගීසින් කෝට්ටේ වැසියන්ට අධික මිලට බඩු භාණ්ඩ විකිණීම.
- කෝට්ටේ නිෂ්පාදන අවම මිලකට පෘතුගීසින් ලබා ගැනීම.
- 7 වන බුවනෙකබාහු රජුට සිය සහෝදරයා මැරීමට දුන් උපදෙස් පිලිනොගැනීම.

## ➢ වීදිය බණ්ඩාර

- ✓ ධර්මපාල කුමරුගේ පියාය.
- ✓ පෘතුගීසි විරෝධී ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පෘතුගීසින් විසින් අත්අඩංගුවට ගෙන කොළඹ සිරකර තබන ලදි. එහෙත් එතුමාගේ බිසව සමුද්‍ර දේවිය උපායශීලිව එයින් නිදහස් කර ගත්තේය.
- ✓ පස්යොදුන් කෝරලයේ පැලෑද ප්‍රදේශයේ බලකොටුවක් ගොඩනඟාගෙන පෘතුගීසි විරෝධී සටනක් ඇරඹීය.
- ✓ මායාදුන්නේ හා පෘතුගීසින් එක්ව පැලෑද බලකොටුව ආක්‍රමණය කොට වීදිය බණ්ඩාර පරාජය කළේය.
- ✓ වීදිය බණ්ඩාර යාපනයට පලාගොස් සිටියදී ගැටුමකින් මරණයට පත් විය.

## ➢ සීතාවක රාජධානිය

- ✓ ආරම්භක පාලකයා මායාදුන්නේ රජුය.
- ✓ පෘතුගීසි විරෝධී පාලකයෙකි.
- ✓ කෝට්ටේ පාලකයින් හා පෘතුගීසින්ට විරුද්ධව සටන් කළේය.
- ✓ 1555 දී මායාදුන්නේගේ පුත් ටිකිරි කුමරු සීතාවක හමුදාවට නායකත්වය දුනි.
- ✓ 1557 මායාදුන්නේ සියලු ශක්තිය යොදා කෝට්ටේ නගරයට ප්‍රහාර එල්ල කල නමුදු පෘතුගීසි යුධ ශක්තිය හමුවේ නගරයට ඇතුළු වීම අපහසු විය.
- ✓ මුල්ලේරියා සටන ඇති වූයේ සීතාවක මායාදුන්නේ රජු දවසය.

## ➢ මුල්ලේරියා සටන

| | |
|---|---|
| ✓ වර්ෂය 1562 | |
| ✓ රජ | සීතාවක මායාදුන්නේ රජු |
| ✓ සිංහල සෙන්පති | මායාදුන්නේ රජුගේ පුත් ටිකිරි කුමරු |
| ✓ පෘතුගීසි සෙන්පති | අපොන්සු පෙරෙයිරාද ලසර්ද |
| ✓ ප්‍රතිඵලය | පෘතුගීසි සොල්දාදුවන් 1600 ක් පමණ මිය යන්නට ඇති ආසියානු රටකදී පෘතුගීසින් ලැබූ දරුණුතම පරාජයයි. |

- 1581 දී සීතාවක මායාදුන්නේ රජු මිය ගිය අතර ටිකිරි කුමරු සීතාවක රාජසිංහ හෙවත් පළමුවන රාජසිංහ නමින් රජ විය.
- 1582 සීතාවක රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කර සීතාවක ඈඳා ගත්තේය.
- කෝට්ටේ රාජ්‍යයේ ප්‍රදේශ කිහිපයක් හා රයිගම රාජ්‍ය ද සීතාවකට ඈඳා ගත්තේය.

## ➢ සීතාවක රාජධානිය පරිහානියට බලපෑ හේතු

- ✓ සීතාවක රාජසිංහ රජුගෙන් පසු නිසි උරුමක්කාරයෙකු නොසිටීම.
- ✓ සීතාවක රාජසිංහ රජු අනුගමනය කල බෞද්ධ විරෝධී ප්‍රතිපත්තිය.
- ✓ රාජසිංහ රජු වීරසුන්දර බණ්ඩාර මැරීම නිසා උඩරට වැසියන්ගේ හානි වීම.
- ✓ පළමු විමලධර්මසූරිය රජු නමින් කොනප්පු බණ්ඩාර උඩරට රජු වීම.

## ➢ යාපනය රාජධානිය

- ∗ රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසුව බිහි වුණි.
- ∗ පාලන කටයුතු මෙහෙයවන ලද්දේ ආර්ය චක්‍රවර්ති නම් රජයේ පෙලපතක් විසිනි.
- ∗ සංකිල රජුගේ පාලන කාලයේදී පෘතුගීසින්ගේ වෙළඳ නැව් වලට බාධා එල්ල කළේය.
- ∗ පෘතුගීසින් කතෝලික ආගම පැතිරවීමට කටයුතු කල විට සංකිලි රජු ඊට එරෙහිව කටයුතු කළේය.
- ∗ 1543 දී පෘතුගීසින් යාපනය ආක්‍රමණය කල අතර සංකිලි රජු කප්පම් ගෙවීමට එකඟ වීමෙන් ගැටුම වැළකුණි.
- ∗ 1548 දී සංකිලි රජු සීතාවක මායාදුන්නේ රජු සමඟ සන්ධානයකට පැමිණියේය.
- ∗ පෘතුගීසි විරෝධී පාලකයෙකු වූ වීදිය බණ්ඩාර යාපනයට පලාගිය අවස්ථාවේ සංකිලි රජු ඔහු පිලිගත්තේය.
- ∗ 1560 දී පෘතුගීසින් යාපනය ආක්‍රමණය කල විට සංකිලි රජු පලා ගියේය.
- ∗ පෘතුගීසින් මන්නාරම අල්ලාගෙන අවට මුතු කිමිදීමෙන් ලැබෙන ආදායම අහිමි විය.

* 1561 දී පුවිරාජපණ්ඩලම් නම් කුමරා සංකිලි සංකිලි රජු බලයෙන් පහකොට යාපනයේ බලය අල්ලා ගත්තේය.
* පුවිරාජපණ්ඩලම් රජුගෙන් පසු යාපනයේ සිංහාසනය සම්බන්ධයෙන් උරුමකරුවන් අතර බල අරගලයක් ඇති විය.
* 1591 දී පෘතුගීසීන් විසින් තමන්ට ගැති පාලකයෙකු වන එදිරිමානසිංහම් නම් රජෙකු බලයට පත්කර ගැනුනි.
* 1619 දී පිලිප් ද ඔලිබිරා යටතේ යැවූ පෘතුගීසි හමුදවක් විසින් සංකිලි රජු සමයේ දී යාපනය ආක්‍රමණය කළේය.
* 1621 දී පෘතුගීසීන් යාපනයේ බලය අල්ලා ගත්තේය.

➢ **යාපනය රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු**

✓ යාපනයේ රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගලය

✓ ප්‍රමාණවත් නිත්‍ය හමුදවක් ඒහි පාලකයින්ට නොසිටීම.

✓ උඩරට රාජධානිය මෙන් ස්වාභාවික ආරක්ෂාවක් නොතිබීම.

➢ **උඩරට රාජධානිය තුළ පෘතුගීසි බලය පැතිරවීමේ ප්‍රයත්න**

1 වන විමලධර්මසූරිය රජු උඩරට බලයට පත් වීමට පෙර එම රාජධානියෙහි බලය පැතිර වීමට පෘතුගීසීන් උත්සහ දරා ඇත. ඉන් අනතුරුව පෘතුගීසීන් උඩරට රාජධානිය තුල බලය පැතිරවීමට දැරූ ප්‍රයත්න නම්,

| වර්ෂය | ස්ථානය හෙවත් සටන | පෘතුගීසි සෙන්පති | සිංහල සෙන්පතියා | උඩරට රජු | ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|
| 1594 | දන්තුරේ | පේරෝ ලෝපේස් ද සූසා | 1 වන විමලධර්මසූරි රජු | 1 වන විමලධර්මසූරි රජු | පෘතුගීසීන් පරාජය වීම. 1 වන විමලධර්මසූරි රජු කුසුමාසන දේවිය විවාහ කරගැනීමෙන් උඩරට රාජධානියේ නීත්‍යානුකූල අයිතිය හිමි කර ගැනීම. |
| 1602 | බලන | දෙන් පෙරනිමෝද අසවේදු | 1 වන විමලධර්මසූරි රජු | 1 වන විමලධර්මසූරි රජු | පෘතුගීසීන් අන්ත පරාජයකට පත් විය. |
| 1630 | රන්දෙනිවල | කොන්ස්තන්තිනූද සා | මහඅස්ථාන කුමරු | සෙනරත් රජු | පෘතුගීසීන් අන්ත පරාජයකට ලක් වුණි. |
| 1638 | ගන්නොරුව | දියෝ ගෝ ද මේලෝ කැස්ත්‍රෝ | දෙවන රාජසිංහ රජු | දෙවන රාජසිංහ රජු | දියෝ ගොද මේලෝ කැස්ත්‍රෝ ජීවිතක්ෂයට පත් වීම හා පෘතුගීසීන් අන්ත පරාජයකට පත් වීම. |

➢ **පෘතුගීසීන්ට උඩරට රාජධානිය යටත් කර ගැනීමට නොහැකි වීමට හේතු**

✓ උඩරට ජනතාව හැමවිටම රජුට සහාය දීම.

✓ පෘතුගීසීන් වෙනුවෙන් සටන් කිරීමට ගිය පහත රැටියන් උඩරටදී රජුට එකතු වීම.

✓ උඩරැටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය

✓ උඩරට රාජධානියේ ස්වාභාවික පිහිටීම (ගිරි දුර්ග, ජල දුර්ග, වන දුර්ග ආදියෙන් සමන්විත වීම)

✓ රජු, රදලයන්, භික්ෂූන් වහන්සේලා හා සාමාන්‍ය ජනතාව තුල තිබූ සමඟිය.

- **ශ්‍රී ලංකාව හා ලන්දේසීන්**
  - ලන්දේසි පාලන කාලය (ක්‍රි.ව. 1658 _ 1796)
  - ලන්දේසීන්ගේ මව්රට ඕලන්දයයි (නෙදර්ලන්තය)
  - 1602 දී ලන්දේසි වෙළඳ සමාගම් කිහිපයක් එකතු කොට පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම හෙවත් VOC සමාගම පිහිටවනු ලැබිණි.
  - ආසියාවේ දේශපාලන හා වෙළඳ කටයුතු මෙහෙයවන්නේ VOC සමාගමයි.
  - ලන්දේසීන් ආසියාවට පැමිණීමේ ප්‍රධාන අරමුණ ආර්ථික වාසි ලබා ගැනීමයි.
  - පෘතුගීසින් මෙරටින් පන්නා දැමීමට උඩරට රජවරුන් ලන්දේසින් සහාය බලාපොරොත්තු වී තිබේ.
  - ක්‍රි.ව. 1602 දී ලන්දේසී දූතයින් දෙදෙනෙකු වන ජොරිස් වෑන් ස්පිල්බර්ජන් හා සී. බෝල්ට් ද වර්ට් නම් දූතයින් පළමුවන විමලධර්මසූරිය රජු මුණ ගැසුණි.
  - උඩරටට පෘතුගීසින්ගෙන් එල්ල වූ ආක්‍රමණ හමුවේ ඔවුන් මෙරටින් පලවා හැරීමට II වන රාජසිංහ රජු නාවික ශක්තියකින් හෙබි ලන්දේසීන්ගේ නිරන්තර සහාය පැතීය.
  - ලන්දේසී හමුද අණදෙන නිලධාරි වෙස්ටර්වර්ල්ඩ් හා උඩරැටියන් එක්ව දෙවන රාජසිංහ රජු මඩකලපුවේ පෘතුගීසි බලකොටුවට පහර දී ඔවුන් පරාජය කිරීමෙන් පසු 1638 දී ලන්දේසීන් සමඟ ගිවිසුමකට එළඹුනි.

- **1638 උඩරට ලන්දේසී ගිවිසුමේ මූලික වගන්ති**
  1) පෘතුගීසින් මෙරටින් පලවා හැරීමට උඩරට රජුට සහය දිය යුතුය.
  2) ලන්දේසීන්ට වැය වන යුධ වියදම්, වෙළඳ ද්‍රව්‍ය (කුරුඳු, ගම්මිරිස්, වී, ඉටි ආදිය) මඟින් ගෙවීමට රජු එකඟ විම.
  3) ඇතුන් හැර උඩරට සෙසු වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීම පිළිබඳ ඒකාධිකාරී අයිතිය ලන්දේසීන්ට ලබා දීම.
  4) පෘතුගීසින්ගෙන් අල්ලා ගන්නා ලද බලකොටුවල රජු අදහස් කරන්නේ නම් ලන්දේසි හමුදාව නතර කරවීමට එකඟ වීම.

  මින් පසු පෘතුගීසින් සතු වූ ත්‍රිකුණාමලය, මීගමුව, ගාල්ල, කළුතර, කොළඹ, මන්නාරම, යාපනය ඇතුළු බලකොටු උඩරට හමුදාව හා ලන්දේසීන් විසින් අල්ලා ගන්නා ලදි.

  1658 දී පෘතුගීසින් ලංකාවෙන් නෙරපා දමන ලදි.

- **දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර මතභේද ඇති වීමට හේතු**

  1638 ගිවිසුමේ සඳහන් පෘතුගීසින්ගෙන් අල්ලා ගත් බලකොටුවල ලන්දේසී හමුද නතර කරවීම රජුගේ කැමැත්ත පරිදි සිදුවිය යුතුව තිබුණද එම වගන්ති අමතක කල ලන්දේසීන් තමන්ට වාසිදයක ප්‍රදේශ වල බලකොටු රජුට බාර දීමෙන් වැළකීම.

- **දෙවන රාජසිංහ රජු ලන්දේසින් මෙරටට කැඳවීමේ අරමුණ**
  - ✓ ලන්දේසි ආධාර ලබාගෙන පෘතුගීසින් ලංකාවෙන් නෙරපීම.
  - ✓ පෘතුගීසින් යටතේ තිබූ ප්‍රදේශ උඩරටට ඈඳගෙන ස්වාධීන හා නිදහස් ලංකාවක් බිහි කිරීම.

- **ලන්දේසීන් හා දෙවන රාජසිංහ රජු සමඟ සුහදතාවය වර්ධනය වීමට බලපෑ කරුණු**
  - ලන්දේසීන් තම ලිපි ගනුදෙනු වලදී රජු “ත්‍රිසිංහලාධීශ්වර” යැයි නාමිකව පිළිගැනීම.
  - රජු ලන්දේසීන්ට ලිපි යවන විට “මට සේවය කරන හිතවත් ලන්දේසී ජාතිය” වැනි පාඨ යෙදීම.
  - ලන්දේසීන් රජුට ලිපි යවන විට “ඔබ වහන්සේගේ සුවච කීකරු සේවක” වැනි පද යොදා ගැනීම.
  - ලන්දේසීන් සමඟ ලිපි ගනුදෙනු වලදී තමා ලංකාවේ අධිරාජයා බවට රජු ප්‍රකාශ කිරීම.

- **උඩරට රාජ්‍ය සම්බන්ධ ලන්දේසීන්ගේ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණ**
  i. උඩරට රාජධානිය සමඟ ගැටුම් වලින් වැළකී සෑම විටම සාමකාමී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
  ii. උඩරට රජුගේ හොඳ හිත දිනා ගැනීමට රජු වෙත තෑගි බෝග ලබා දීම, රජු හමුවට දූත පිරිස් යැවීම, රජු සමඟ ලිපි හුවමාරු කරගැනීම, මේ මඟින් උඩරට වැඩෙන කුරුඳු තමන් වෙතට ලබාගැනීම ලන්දේසීන්ගේ අපේක්ෂාව විය.
  iii. දෙවන විමලධර්මසූරිය, ශ්‍රී විජය රාජසිංහ හා කීර්ති ශ්‍රී රාජසිංහ වැනි රජවරුන් උපසම්පදාව ගෙන ඒම වැනි ආගමික කටයුතු වලට නාවික සහාය ලබා ගැනීම.

- **මෙරටින් උපරිම ආර්ථික වාසි ලබා ගැනීමට ලන්දේසීන් අනුගමනය කල ප්‍රතිපත්ති**
    1. උඩරට රජු වෙනත් විදේශිකයන් සමඟ වෙළෙඳ සබඳතා පැවැත්වීම හැකි තරම් අඩු කිරීම.
    2. රජු සමඟ මත ගැටුම් ඇති වූ විට උඩරට හා පහතරට අතර කඩවත් වසා දැමීම.
    3. පහතරට ඇතැම් ප්‍රදේශ වල වී වගාව දියුණු කිරීමට ලන්දේසීන් කටයුතු කිරීම (මුතුරාජවෙල අස්වැද්දවීම) මෙයින් සහල් ආයතනයට යන වියදම අවම කර ගැනීම ලන්දේසීන්ගේ අරමුණ විය.
    4. කුරුඳු ක්‍රමවත් ලෙස වගා කිරීමට කටයුතු කිරීම (කුරුඳුවත්ත, කදිරාන, ඇවරියවත්ත)
    5. ලන්දේසීන්ට ලාභ ලැබිය හැකි උක්, කෝපි, කපු, දුම්කොළ ආදිය වගා කරවීමට ක්‍රියා කිරීම.

- **ලන්දේසීන්ගෙන් මෙරටට ලැබුණු වෙනත් ප්‍රතිලාභ**
    * රෝම ලන්දේසි නීතිය මෙරටට උරුම වීම.
    * රෙපරමාදු ආගම ලැබීම.
    * විවිධ ආහාර වර්ග ලැබීම. (කේක්, කොකිස්)
    * භාෂාවට විවිධ වචන එකතු වීම. (ස්තෝප්පුව, තෝල්කය, නොතාරිස්, අල්මාරිය, සොල්දරය වැනි වචන)
    * හැමිල්ටන් ඇළ ඇතුළු ඇළ මාර්ග කිහිපයක් ඉදි කිරීම. (භාණ්ඩ හා මගී ප්‍රවාහනය සඳහා)

- **උඩරට රාජ්‍ය හා ලන්දේසීන් අතර ඇති වූ ගැටුම්**
    * 1760 අවසාන භාගයේ මීගමුව හා මාතර වැනි ප්‍රදේශවල ලන්දේසි විරෝධී කැරලි ඇති විය. මෙයින් කටුවන කොටුව, මාතර කොටුව ඇතුළු ස්ථාන කිහිපයක් යටත් කර ගැනීම නමුත් අවසානයේදී මේ ප්‍රදේශ ලන්දේසි සතු විය.
    * 1764 දී ලන්දේසි ආණ්ඩුකාර බැරන් වැන් එක් සේනාංක 6 ක් යොද ගනිමින් උඩරට ආක්‍රමණය කළද එය අසාර්ථක විය.
    * 1765 දී තනි එක් ආණ්ඩුකාරවරයා උඩරට ආක්‍රමණයක් එල්ල කිරීම.

- **1766 කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසි සමඟ ඇතිකරගත් ගිවිසුම**

ලන්දේසීන්ගේ ආක්‍රමණ තර්ජන හා යුද්ධ වලින් පීඩා විඳීම නිසා 1766 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසි ආණ්ඩුකාර විලෙම් ෆල්ත් ආණ්ඩුකාරවරයා සමඟ සාම ගිවිසුමකට එළඹුනි.

- **ගිවිසුමේ කොන්දේසි**
    * මුහුදුබඩ ගව්වක් පළල බිම් තීරුව ලන්දේසීන්ට පැවරීම
    * කොළඹ, ගාල්ල, මාතර, යාපනය දිසාවන් සහ ත්‍රිකුණාමලය, මන්නාරම, කල්පිටිය යන වරායන් ලන්දේසීන්ට පවරා දිය යුතුය.
    * කන්ද උඩරට වෙළඳම කුරුඳු තැලීම, දැව දඬු කපා ගැනීමට රජු අවසර දිය යුතුය.
    * ලුණු ලේවායන්හි අයිතිය උඩරටට ඇති අතර ලන්දේසීන්ට මුහුදුබඩ ප්‍රදේශ පවරා දීමෙන් යම් පාඩුවක් වේ නම්, වාර්ෂිකව යම් මුදලක් ලන්දේසීන් විසින් රජුට ගෙවිය යුතුය.
    * උඩරටින් පහතරටට ගිය සිංහලයන්ද, පහතරටින් උඩරටට ගිය සිංහලයන්ද ආපසු යැවිය යුතුය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසින් සමඟ ඇති කරගත් මෙම ගිවිසුම ලංකා ඉතිහාසය තුළ උඩරට රජෙකු විසින් ඇති කරගත් අවාසිදායකම ගිවිසුම විය.

01. පුරාණ අවධියේ සිට ආසියාව හා යුරෝපය අතර පැවති වෙළඳ මාර්ග තුන නම් කරන්න.
02. පෙරදිග හා අපරදිග වෙළඳාමේ අතරමැදියන් ලෙස විශාල වශයෙන් ලාභ ලැබුවේ කුමන ජාතියද?
03. පෙර අපරදිග වෙළඳාමේ ප්‍රධාන වෙළඳ මාර්ග 3 ම සම්බන්ධ වූ නගරය කුමක්ද?
04. කොන්ස්තන්තිනෝපල් නගරය වර්තමානයේ හඳුන්වන නම කුමක්ද?
05. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අල්ලා ගැනීම නිසා යුරෝපීයන්ට මුහුණ දීමට සිදු වූ ගැටලු මොනවාද?
06. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් සතු වූයේ කුමන වර්ෂයේද?
07. දේශ ගවේෂණ කටයුතු සඳහා උනන්දුව ඇති කිරීමට පෘතුගාලයේ නාවික හෙන්රි කුමාරයා ගත් ක්‍රියාමාර්ග මොනවාද?
08. ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තිය ආරම්භ වූයේ කුමන වර්ෂයේද?
09. පෘතුගීසීන් ආසියාවට පැමිණීමේ මූලික අරමුණ වූයේ කුමක්ද?
10. ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණි වස්කෝද ගාමා කළ ප්‍රකාශය කුමක්ද?
11. පෘතුගීසීන් ලංකාව මුල් කාලයේ හැඳින් වූ නම කුමක්ද?
12. ලංකාවට පැමිණි පෘතුගීසි ජාතිකයා කවරෙක්ද?
13. ලොරෙන්සෝද අල්මේදාගේ පියා නම් කරන්න.
14. පෘතුගීසි ලංකාවට එන විට මෙරට පැවති දේශපාලන ඒකක කවරේද?
15. පෘතුගීසි නියෝජිතයන් කෝට්ටේ රජු වෙත රැගෙන ගිය ගමන් මාර්ගය පිළිබඳව ඉතිහාසයේ සඳහන් වන ප්‍රස්ථා පිරුළ කුමක්ද?
16. VIII වන වීර වික්‍රමබාහුගෙන් පසු කෝට්ටේ බලයට පත් වූ රජු කවරෙක්ද?
17. හයවන විජයබාහුගේ පුතුන් තිදෙනා නම් කරන්න.
18. VI වන විජයබාහු කෝට්ටේ රාජ්‍ය උරුමය පැවරීමට සැලසුම් කළ කුමාරයා කවරෙක්ද?
19. 1521 විජයබා කොල්ලයේදී VI වන විජයබාහු රජු මරණයට පත් කළේ කවරෙක්ද?
20. විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍ය බෙදී ගිය ආකාරය කෙසේද?
21. කෝට්ටේ හත්වන බුවනෙකබාහු රජුගේ දියණිය කුමන නමකින් හැඳින්වේද?
22. සමුද්‍රා දේවි කුමරිය විවාහ වූයේ කවරෙක් සමඟද?
23. වීදිය බණ්ඩාර හා සමුද්‍රා දේවියගෙන් ඉපදුණු දරුවන් දෙදෙනා නම් කරන්න.
24. හත්වන බුවනෙකබාහුගෙන් පසු කෝට්ටේ රාජ්‍ය උරුමය පවරන ලද කුමාරයා කවරෙක්ද?
25. සීතාවක මායාදුන්නේ රජුට පෘතුගීසීන් මෙරටින් එලවා දැමීමට සහාය දුන් ඉන්දියාවේ මුස්ලිම් අධිරාජ්‍යයා කවරෙක්ද?
26. පෘතුගීසි සොල්දාදුවෙකුගේ වෙඩි පහරින් VII වන බුවනෙකබාහු රජු මිය ගියේ කුමන වර්ෂයේද?
27. ධර්මපාල රජු හෞතීස්ම වී කතෝලික ආගම වැළඳ ගැනීමෙන් පසු භාවිතා කළ නම කුමක්ද?
28. දොන් ජුවන් ධර්මපාල මිය යන විට තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජ්‍ය පෘතුගීසීන්ට අන්තිම කැමති පත්‍රයකින් පැවරුවේ කුමන වර්ෂයේද?
29. වීදිය බණ්ඩාර පස් යොදුන් කෝරළයේ බලකොටුවක් ඉදි කළේ කුමන ස්ථානයේද?
30. සීතාවක රාජධානියේ ආරම්භක පාලකයා කවරෙක්ද?
31. මායාදුන්නේ පුතා වූ ටිකිරි බණ්ඩාර කුමන නමකින් සීතාවක රාජ්‍යයත්වයට පත් වූවේද?
32. සීතාවක රාජධානිය පෘතුගීසීන්ට විරුද්ධව සටන් කළ අවස්ථා නම් කරන්න.
33. පෘතුගීසීන් මුලු පෙරදිගින්ම අන්ත පරාජයට පත් වූ සටන කුමක්ද?
34. මුල්ලේරියා සටනේ දී පෘතුගීසීන්ගෙන් මිය ගිය සංඛ්‍යාව කොපමණද?
35. මුල්ලේරියා සටන සිදු වූ දෙපිරිස කවරෙක්ද?
36. කෝට්ටේ ධර්මපාල රජු කෝට්ටේ නගරය අත්හැර කොළඹ කොටුවට පැමිණියේ කුමන වර්ෂයේද?
37. සීතාවක පළමුවෙනි රාජසිංහ උඩරට ආක්‍රමණය කළේ කුමන වර්ෂයේද?
38. උඩරට ආක්‍රමණය කරන විට උඩරට රාජ්‍යයේ සිටි පාලකයා කවරෙක්ද?
39. කරලියද්දේ බණ්ඩාර රජුගේ දියණිය හා බෑණා කවරෙක්දැයි නම් කරන්න.
40. පළමුවෙනි රාජසිංහ රජුට උඩරට ආක්‍රමණය සඳහා උදව් කළ උඩරට රදළ ප්‍රධානියා කවරෙක්ද?
41. උඩරට කරලියද්දේ බණ්ඩාර ආරක්ෂාව සඳහා පලා ගියේ කුමන ස්ථානයටද?
42. හෞතීස්ම වීමෙන් පසු කුසුමාසන දේවිය හා යමසිංහ බණ්ඩාර කුමන නම් වලින් හැඳින්වේද?
43. සීතාවක පළමුවෙනි රාජසිංහ රජු මිය යෑමට කුමන හේතුවක් බලපෑවේද?
44. පේරාදෙණියේ වීරසුන්දර බණ්ඩාරගේ පුතා හැඳින්වූ නම කුමක්ද?
45. සීතාවක රාජධානියේ බලවර්ධනය හා බල ව්‍යාප්තිය සිදු වූ අවස්ථා කවරේද?
46. සීතාවක රාජධානියේ බිඳ වැටීම හා පරිහානියට හේතු කවරේද?
47. පෘතුගීසීන් ලංකාවට එන විට යාපනයේ සිටි ආර්ය චක්‍රවර්ති පරපුරෙන් පැවත එන කුමන පාලකයාද?

48. පරරාජසේකරම් බලයෙන් පහකොට යාපනයේ බලයට පත් වූ පාලකයා කවරෙක්ද?
49. පෘතුගීසින් සංකිලි රජුට විරුද්ධව ආක්‍රමණය කළ වර්ෂය කුමක්ද?
50. යාපනයේ සංකිලි රජු සීතාවක මායාදුන්නේ සමඟ සන්ධාන ගත වූ වර්ෂය කුමක්ද?
51. දෙවන වරට සංකිලි රජුට විරුද්ධව යාපනයට ආක්‍රමණයක් පෘතුගීසින් සිදු කළ වර්ෂය කුමක්ද?
52. පෘතුගීසින් යාපනය අල්ලා ගෙන බලකොටුවක් ඉදිකළ ස්ථානය කුමක්ද?
53. සංකිලි රජු බලයෙන් පහ කොට යාපනයේ බලයට පත් වූ රජු කවරෙක්ද?
54. ක්‍රි.ව. 1591 දී පෘතුගීසින් යාපනය ආක්‍රමණය කොට පෘතුගීසින් ගැති පාලකයෙක් වශයෙන් ලත් කළේ කවරෙක්ද?
55. යාපනය යටත් කිරීම සඳහා ක්‍රි.ව. 1619 දී යාපනයට යවන ලද පෘතුගීසි සෙන්පතියා කවරෙක්ද?
56. පෘතුගීසින් යාපනයේ බලය සම්පූර්ණයෙන්ම පිහිටුවන ලද වර්ෂය කුමක්ද?
57. පෘතුගීසින් උඩරට ආක්‍රමණය කළ අවස්ථා වලදී සටන් ඇත් වුණු ස්ථාන නම් කරන්න.
58. උඩරට පෘතුගීසින් ආක්‍රමණ අවස්ථා වලදී ඒ සඳහා මුහුණ දුන් උඩරට රජවරු හා පෘතුගීසි සෙන්පතිවරු නම් කරන්න.
59. උඩරට සෙනරත් රජු හා පෘතුගීසින් සමඟ සාම ගිවිසුමක් අත්සන් කළේ කුමන වර්ෂයේද?
60. රන්දෙනිවල සටන සඳහා පෘතුගීසි සෙන්පති කොන්ස්තන්තීනු ද සා සමඟ පැමිණි හමුදා සේනාංක ප්‍රමාණය කොපමණද?
61. රන්දෙනිවල සටනින් පෘතුගීසි හමුදාවේ මියගිය සංඛ්‍යාව කොපමණද?
62. පෘතුගීසි උඩරට ආක්‍රමණ සියල්ලම අසාර්ථක වීමට බලපෑ හේතු කවරේද?
63. ලන්දේසීන්ගේ මව්රට කුමක්ද?
64. පෙරදිග වෙළඳ කටයුතු කළ ඕලන්ද වෙළඳ සමාගම කුමක්ද?
65. ඕලන්ද වෙළඳ සමාගම පිහිටුවන ලද වර්ෂය කුමක්ද?
66. ඕලන්ද වෙළඳ සමාගමේ පෙරදිග මූලස්ථානය පිහිටියේ කොහේද?
67. ලන්දේසීන් උඩරට රජු සමඟ සම්බන්ධතා පැවැත්වීමට පළමුව පැමිණි ලන්දේසී දූතයා කවරෙක්ද?
68. දෙවනුව පැමිණි ලන්දේසී දූතයා කවරෙක්ද?
69. II වන රාජසිංහ රජුගේ ප්‍රධාන අරමුණ වූයේ කුමක්ද?
70. පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම සඳහා II වන රාජසිංහ උදව් ලබාගත් යුරෝපා ජාතිය නම් කරන්න.
71. II වන රාජසිංහ හා ලන්දේසීන් අතර පෘතුගීසින් එලවා දැමීම සඳහා අත්සන් කල ගිවිසුම කුමක්ද?
72. ලන්දේසීන් 1638 ගිවිසුම අනුව පළමුව පහර දුන් පෘතුගීසි බලකොටුව කුමක්ද?
73. 1638 උඩරට ලන්දේසි ගිවිසුමේ අඩංගු වූ කරුණු මොනවාද?
74. පෘතුගීසින්ට පහර දී ලංදේසීන් යටත් කරගත් බලකොටු නම් කරන්න.
75. පෘතුගීසින් මෙරටින් සහමුලින්ම පලවා හැරියේ කුමන වර්ෂයේද?
76. ලන්දේසීන් සමඟ II වන රාජසිංහ රජු ලිපිගොනු වලදී භාවිතා කළ නාමය කුමක්ද?
77. ලන්දේසීන් II වන රාජසිංහ සමඟ ලිපි ගනුදෙනු වලදී භාවිතා කළ ආමන්ත්‍රණ පාඨය කුමක්ද?
78. උඩරට රාජ්‍ය සම්බන්ධව ලන්දේසීන් අනුගමනය කළ ප්‍රතිපත්ති වල කැපී පෙනෙන ලක්ෂණ කවරේද?
79. ආර්ථික වාසි ලබා ගැනීම සඳහා ලන්දේසීන් අනුගමනය කළ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ කවරේද?
80. උඩරට ආක්‍රමණය කිරීමට කටයුතු කළ ලන්දේසි ආණ්ඩුකාරවරයා කවරෙක්ද?
81. ලන්දේසීන් උඩරට දෙවන වර ආක්‍රමණය කල වර්ෂය කුමක්ද?
82. ක්‍රි.ව. 1766 ලන්දේසීන් සමඟ සාම ගිවිසුමක් අත්සන් කල රජු නම් කරන්න.
83. 1766 ගිවිසුමේ අඩංගු වගන්ති මොනවාද?

*සැකසුම :- සජිත් කරුණාරත්න*
*විහාර මහාදේවි බාලිකා විද්‍යාලය*
*කිරිබත්ගොඩ*